## වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

## 2022 වර්ෂයේ /52 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව -කෙටුම්පතකි

## 2022-06-09

**පැමිණීම**

1. ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා
2. ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා
7. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
8. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
9. ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
10. ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
11. ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා
12. ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය
13. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය
14. ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
15. ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය
16. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා
17. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා
18. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා
19. ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
20. ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
21. ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
22. ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා
23. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා
24. ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
25. ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා
26. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා
27. ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය

28. ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
29. ගරු මන්ත්‍රිනී එම්.එම්.මේරි.වාලව් කුරේ මහත්මිය
30. ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි වමෝදරී ප්‍රනාන්දු මහත්මිය
31. ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය
32. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා
33. ගරු මන්ත්‍රිනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
34. ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා
35. ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා
36. ගරු මන්ත්‍රී අයි.බී.සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා
37. ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුහසිංහ මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## 01. 2022-05-19 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය මහා සභාවේ ගරු සභාපතිතුමාගේ කතාව අවස්ථාවේදී ගරු සභාපතිතුමා විසින් තමාට ප්‍රකාශයක් සිදු කල බවත්, තමන් පිළිබඳව තොරතුරු ඇති බවත් එබැවින් තමන්ව අත්අඩංගුවට ගන්නා බවට පැවසූ බවත්, එය මෙම වාර්තාවට ඇතුළත් වී නොමැති බැවින් එය ඇතුළත් කරන ලෙසද ඉල්ලා සිටින ලදී.

තමන් ඉදිරියේදී එතුමාව බලාගන්නවා යනුවෙන් එදින ප්‍රකාශ කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය ඇතුළත් කරන ලෙසට ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

හඬපටිය පරීක්ෂා කර බලා එය ඇතුළත් කරන බව ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

| |
|---|
| තීරණ අංක 01<br><br>**2022-05-19 වන දින පැවති මහා සභා වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.** |

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

01. පසුගිය මහා සභාවේදී සාක්ච්ඡා කල සහ එළඹුණු ගරු මහා සභා තීරණයන්ට අදාල ප්‍රගතිය ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

- ලුණුවිල සතිපොළ භූමියේ නළළිඳ ඉදි කිරීම සම්බන්ධ වාර්තාව ලැබී ඇති බවත් ඒ පිළිබඳව ඉදිරි අවශ්‍ය කටයුතු සිදු කරන බවත් දැනුම් දෙන ලදී.
- මාර්තු මස විදුලි පහන් අළුත්වැඩියා වාර්තාවේ සංශෝධිත වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ට ලැබීමට සලස්වා ඇති බවද දැනුම් දෙන ලදී.
- කර්මාන්ත සිදු කිරීම සඳහා නව රේට්ස් ලබා ගැනීම පිළිබඳව තමන් සාකච්ඡා කල බවත් මෙම සිකුරාදා දින එම රැස්වීමෙන් අනතුරුව මිල ගණන් බලා නව රේට්ස් ලබා දීමට කටයුතු කරන බව පැවසූ බවත් දැනුම් දෙන ලදී.
- සූර්ය බල ශක්ති පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳව පසුගිය මුදල් කමිටුවටද යොමු කල බවත් ඒ පිළිබඳව සම්පූර්ණ දැනුවත් කිරීමක් මෙම මහා සභාවේදී අදාල විශය භාර නිලධාරී ගෙන්වා සිදු කිරීමට බලාපොරොත්තු වන බවත් දැනුම් දුන් අතරඅවශ්‍ය කරන මුදල් ගෙවා නීතිමය වැඩ කටයුතුද සිදු කර අවසන් බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.
- සේවක ණය අත්තිකාරම් ගිණුම ආරම්භ කිරීම සම්බන්ධයෙන් පසුගිය මහා සභාවේදී තීරණය කල බවත්,එය මුදල් කමිටුවට යොමු කර අවශ්‍ය තීරණය ගෙන ඇති බවත් දැනුම් දෙන ලදී.
- මාර්ග ගැසට් කිරීම සම්බන්ධයෙන් ලේකම්මහතා හෙට දින අදාල ආයතනයට යන බවත්, එහි වැඩ කටයුතුද සිදු වෙමින් පවතින බවත් දැනුම් දෙන ලදී.ගැසට් තල පසුව නඩු මහට යාමටද බිය විය යුතු නැති බවත් සම්පූර්ණ විස්තරය ගැසට් කරන බවත් ප්‍රකාශ කරන ලදී.
- වෙරළ තීරයේ බීකන් බල්බ පිළිබඳව ඉදිරිපත් කල ගැටළුව පසුගිය මුදල් කමිටුවට යොමු කල බවත්, එහිදී විෂය භාර නිලධාරීතුමාව සමථ මණ්ඩලයට යැවීමට තීරණය කල බව දැනුම් දෙන ලදී.
- මෙම මස පසුගිය දිනවල පැවති මුදල් කමිටු වාර්තාව සහ ක්‍රීඩා කමිටු වාර්තාව ඒවායෙහි තිබෙන තීරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බැවින් අද දින ගරු මහා සභාව වෙත ඉදිරිපත් කර ඇති බවද දැනුම් දෙන ලදී.

## 02.නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතාට එතුමාගේ නිවස අහිමි වූ බැවින් මහා සභා න්‍යාය පත්‍රයවත් ලබා දීමට නොහැකි වූ බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 02

මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
- ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා
- ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා
- ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා

b) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 03

2022 මාර්තු මස මැයි මස පැවති පහත සඳහන් කාරක සභා සඳහා **සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**2022 මාර්තු මස 29 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| **2.** | ගරු මන්ත්රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්රනාන්දු මහතා |
| **3.** | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| **4.** | ගරු මන්ත්රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| **5.** | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| **6.** | ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

**2022 මැයි මස මස 06 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | නම |
|---|---|

| | |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා |
| **2.** | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **3.** | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| **4.** | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| **5.** | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා |
| **6.** | ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා |
| **7.** | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |
| **8.** | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා |

**2022 මැයි මස 26 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **2.** | ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා |
| **3.** | ගරු මන්ත්‍රී කේ.ඒල්.සී.කුමාර කරුණානායක මහතා |
| **4.** | ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා |
| **5.** | ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා |
| **6.** | ගරු මන්ත්‍රී ඩබ්. ස්ටැන්ලි තිසේරා මහතා |
| **7.** | ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය |
| **8.** | ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා |
| **9.** | ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා |
| **10.** | ගරු මන්ත්‍රී වි.කේ.එම්. අසන්ත කුලසේකර මහතා |

03. මන්ත්‍රීවරුන්ගේ whatsApp group එකටද විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කරන ලෙසට දැනුම් දුන් බවත් ඊයේ දිනයේදී ද මේවා පිළිබඳව සාකච්ඡා කල බවත් ප්‍රකාශ කරන ලදී. විදුලි අමාත්‍යාංශයේ ප්‍රධාන විදුලි ඉංජිනේරු මහතා වන සුනෙත්ති බල ශක්ති අධිකාරී සනත් කිත්සිරි මහතා වෙන්නප්පුවේ සිටින බවත් තමන් සමඟ එතුමා සාකච්ඡා කල බවත් එමෙන්ම මේවා සම්බන්ධයෙන් පොදු පහසුකම් කමිටුවේද සාකච්ඡා කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අද වන විට අතිගරු ජනාධිපතිතුමා මොවුන්ට සතියට එක් දිනක් නිවාඩු ගන්නා ලෙසටත් එම දිනයේදී තම ප්‍රදේශයේ ආයතන මේවා පිළිබඳව දැනුවත් කරන ලෙසටද අවසර දී ඇති බවත් තමන්ද ඊළඟ මහා සභාවට එතුමාව ගෙන්වන බවත් ප්‍රකාශ කරන ලදී. මෙම වැඩ කටයුතු ක්‍රියාත්මක කරමින් යන විටදී අප සභාවේ උපදේශකවරයා ලෙස එතුමාවම පත් කරගැනීමට සූදානම් වී සිටින බවත් ඒ සඳහා අනුමැතිය ගැනීමට අද දින මහා සභාවට යොමු කරන බවත් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම සූර්ය බල ශක්ති පද්ධතිය ලබා ගැනීමට අවශ්‍ය ගරු මන්ත්‍රීවරයෙකු/වරියෙකු සිටීනම් එය ලබාගැනීමට හැකියාවක් තිබෙන බවත් තමුන් වියදම් කර එය ලබා ගත යුතු බවත් ඒ සඳහා අවම රේට් අගයක් සහිත සහයෝගයක්ද ලබාදෙන බවත් එවිට නිවසේ විදුලි බිල ඉතිරි කර ගැනීමටද හැකි වන බවත් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම මාර්ග විදුලි පහන් එක් ස්ථානයකින් නිවීමට හැකි වන පරිදි එතුමා සකස් කරදෙන බවද පැවසූ බවත්, ඒ සඳහා විශේෂ ස්තුතියක්ද පුද කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.සම්පත් අප සතුව තිබෙන බවත්,අදහස් තිබුනද ඒවා ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී.මෙම සූර්ය බල ශක්තිය වෙන්නප්පුවට ගැනීම පිළිබඳව තමන් අතිගරු ජනාධිපතිතුමාට ලිපිද යැවූ බවත් ඒවායෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම තත්ත්වය උදා වීඇති බවත් ප්‍රකාශ කරන ලදී.

04. 2022 අප්‍රියෙල්මස සහ මැයි මස පහත සඳහන් මාර්ග වල වලවල් ප්‍රීමික්ස් අතුරා සංවර්ධනය කිරීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ගරු සභාපතිතුමා ස්තුතිය පුද කරන ලදී.

- උදාසිරිගම 06 වන පටුමඟ

- ➢ උදාසිරිගම 06 වන පටුමඟ ඉතිරි කොටස
- ➢ මැල්ලව දුමුන්නාගාර මාර්ගයේ ප්‍රවේශය
- ➢ කිරිමැටියාන පාසල අසල මාර්ගය ඉතිරි කොටස
- ➢ කිරිමැටියාන පිං ලිඳ පාර
- ➢ ගෝනාවිල සිස්ටර් හෙලේනා මාවත
- ➢ ගෝනාවිල සිස්ටර් හෙලේනා මාවත ඉතිරි කොටස
- ➢ මැන්රෝසා පාර දුම්මලකොටුව
- ➢ ගෝනාවිල රංගිරි උළු මෝල අසල මාර්ගයේ වලවල්
- ➢ ජයරත්න මහතාගේ නිවස අසල පාර ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම

05. රටක් ලෙස අද වන විට ආහාර හිඟයට පිළියමක් ලෙස කෙලෙස කටයුතු කල යුතුදැයි සියළු දෙනාම දන්නා බවත්, එම නිසා තමන් කෘෂිකර්ම පර්යේෂණ ආයතන දෙකෙහිම නිලධාරීන් සමඟ සාකච්ඡා කොට අක්කර ½ ඉඩම් සංවර්ධනය කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. කෘෂි නිලධාරී ග්‍රාමීය කමිටුව රැස්වීමට තමන් දැනුම් දුන්නද එය ක්‍රියාත්මක වී නොමැති බවත්, එය අප මන්ත්‍රීවරුන්ගෙන් ශක්තිමත් වන බවත් ප්‍රකාශ කරන ලදී.නිලධාරීන් මේවාට අනුගත නොවන බවත්, සෑම අඟහරුවාදා දිනකම මේ සඳහා සම්බන්ධ වන ලෙසට ගරු මන්ත්‍රීවරුන්ටද දැනුම් දෙන ලදී. නගුලක් ට්‍රැක්ටරයකට සවිකල බවත්, අවශ්‍ය අවස්ථාවලදී ඒය ලබාදෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. ඒක් වසමකින් ඉඩම් කැබලි පහක් සොයාගත් විට ඒවායෙහි විවිධ භෝග වගාකල හැකි බවත්, ආහාර අර්බුදයට පිළියමක් එමඟින් ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී. කොට්ඨාසභාර මන්ත්‍රීවරයාගේ ප්‍රතිපාදන වලින් ඒ සඳහා මුදල් ලබාගත හැකි බවත්, මාර්ග පාලම් බෝක්කු සෑදීම මඳකට නතර කොට ඒය සිදු කිරීමට අවශ්‍ය ලක්ෂ 2ක පමණ මුදල මන්ත්‍රී ප්‍රතිපාදන වලින් ලබා දෙන ලෙසටද ඉල්ලා සිටින ලදී. එමෙන්ම සිංගක්කුලියේ රෝයි මහතා විසින් පසුගිය දින මඤ්ඤොක්කා දඬු ලබා දුන් බවත්, ඒවා ගෙනැවිත් හාල්දඬුවන කෘෂිකර්ම මධ්‍යස්ථානය මඟින් අවශ්‍ය කරන වැඩ කටයුත්ත ආරම්භ කල බවත් එමෙන්ම වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් ඉඩම් සොයා වගා කිරීමට අවශ්‍ය වටපිටාව සකස් කරදෙන බවත් ප්‍රකාශ කරන ලදී. තමන් විසින් අදාල නිලධාරීන්ට මන්ත්‍රීවරුන් හා සම්බන්ධ වන ලෙසට පැවසූ බවද ප්‍රකාශ කරන ලදී.

සෑම වසමකම නිලධාරීන් පස් දෙනෙකු සිටින බවත්, ඒවා මන්ත්‍රීවරුන්ට අධීක්ෂණය කිරීමට නොහැකි බවත්, එබැවින් ඒම නිලධාරීන් ගෙන්වා දැනුවත් කිරීමක් සිදු කරන ලෙසටද අවශ්‍ය නිලධාරීන් වැඩක් සිදු නොකරන්නේ නම් මේවාද සිදු කර පලක් නොවන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.වෙන්නප්පුව ආසනයේ මඤ්ඤොක්කා,කෙසෙල් වගාකර ඇති ඉඩම් කීයක් තිබේදැයිද නමුත් සෑම වසමකටම කෘෂිකර්ම නිලධාරී, සංවර්ධන නිලධාරී හා සමෘද්ධි නිලධාරියෙකු සිටින බවත් ඔවුන් වැඩක් නොකරන්නේ නම් මෙම සිදු කරන දේ වලින් මේවා සඳහා වැය කරන මුදලින් කිසිඳු පලක් නොවන බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ග්‍රාමීය කමිටුව රැස් කරන ලෙසටත්, ඒ්වා අධීක්ෂණය කරන ලෙසටත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

ස්වෙච්ඡාවෙන් ගොස් මෙම වැඩකටයුතු සිදු කරනුයේ නිලධාරීන් ස්වල්පයක් පමණක් බවත්,අනෙක් සියළු දෙනාට නියෝගයක් දුනහොත් පමණක් ඒවා සිදු කරන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

කෘෂිකර්ම නිලධාරීන් සමඟම සම්බන්ධ වී මෙම වැඩ කටයුත්තට දායකත්වය ලබා දීමට තමන් බලාපොරොත්තු වන බවත්, පෞද්ගලික ඉඩම්ද මේවා සඳහා යොදා ගැනීමට සිදු වන බවත්,මේවා ඔස්සේවැඩ කටයුතු සිදු කර ප්‍රගතියක් බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමාගේ අදහස ඉතාමත් හොඳ බවත්, නමුත් ඉදිරියේදී අස්වැන්න මිලදී ගෙන බෙදා දීමටද සිදු වන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

නිකවැරටිය බීජ මධ්‍යස්ථානයට කතා කල බවත්, එහිදී කව්පි, මුංඇට වැනි බීජ වර්ග අඩු මුදලට ගැනීමට බලාපොරොත්තු වන බවත්,තම තමන් වගකීම නිවැරදිව සිදු කලහොත් ජය ගැනීමට හැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.ලංකාවේම නොව වෙන්නප්පුව ආසනයේ මෙය ක්‍රියාත්මක වන බවත් ඒ සඳහා දායකත්වය ලබාදෙන ලෙසත් අඩුපාඩු තිබිය හැකි බවත් මේවා සියල්ල තේරුම්ගෙන බලයේ සිටින කාලයේදී මෙම වැඩ කටයුත්තට දායකත්වය ලබා දෙමුයැයිද ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා ස්ථාවර කමිටුවක් දමමුයැයි ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා පරිසර කමිටුවද පොදු පහසුකම් කමිටුවද තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සභාවේ ඉඩම් තෝරාගෙන ඒවා බදුදෙමුයැයිද ගොවිජන නිලධාරීන් හරහා මේවා බදු ගැනීමට ස්ථිර පුද්ගලයෙකු තෝරා ගනිමුයැයිද ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

සභාපතිතුමෙකු නම් කර නව කමිටුවක් මේ සඳහා පත්කර ගනිමුයැයිද විපක්ෂයක් ලෙසද සහයෝගය ලබා දීමට හැකි බවත්  ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

එය පරිසර කමිටුවෙන්ම සිදු කරන ලෙස ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී. පළමුව දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්ම මෙය ආරම්භ කල බවත්, මන්ද ගොවීන් වැඩි ප්‍රමාණයක් සිටිනුයේ දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බවත් මේ සඳහා අවසරය ලබාදෙන ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේවා හඳුනාගත් පසුව මුදල් වෙන් කරමුයැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මහා සභාවේ අවසරය ගෙන තබා ගනිමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහි සාර්ථක මෙන්ම අසාර්ථක තත්ත්ව තිබෙන බවත්, වැඩසටහනක් ආරම්භ කර මුදල් ඉල්ලූ විට එය ලබාදෙන ලෙසත්,අවශ්‍ය විට පමණක් එය ලබා ගනිමුයැයි ද ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.

සියළු දෙනාම ග්‍රාමීය කමිටුවට සහභාගී වන ලෙසත්, මේ වන විට නිලදාරීන් විසින් මන්ත්‍රීවරුන්ට ආරාධනා නොකරන බවත් තිබෙන තත්ත්වය තේරුම් ගෙන වැඩකටයුතු සිදු කරන ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මන්ත්‍රීවරුන් නොමැතිව වැඩ කටයුතු කිරීමට නිලධාරීන් කැමති බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

නිල බලයෙන් මන්ත්‍රීවරුන්ට ඒ් සඳහා අයිතියක් තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා කමිටුවක් පත්කරමුයැයිද ,එවිට නිලධාරීන්ට මන්ත්‍රීවරුන් සමඟ කතා කිරීමට සිදු වන බවත් ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.
අක්කර ¼ පමණ ඉඩම් කොටස් සකස් කර දෙන ලෙසට පළමු ඉල්ලීම සිදු කල බවත්, එයට අවශ්‍ය නගුල තමන් සවි කල බවත්, තෙල් සඳහා මුදල් වැය වන බවත් මේවා සිදු කරගෙන යාමට අනුමැතියද ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.

හොඳ බීජ ලබාගෙන බෙදාදෙන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ඉල්ලා සිටින ලදී.

පක්ෂ විපක්ෂ සියලු දෙනාටම මේ සඳහා සහභාගී විය හැකි බවත්, කතාකර හිතේ තිබෙන හොඳ අදහස් ඉදිරිපත් කරන ලෙසටද ගරු සභාපතිතුමා මන්ත්‍රීවරුන්ට පවසා සිටින ලදී.

එම ලබාදෙන මුදල පිළිබඳව ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා විමසා සිටි අතර මන්ත්‍රීවරයාගේ ඉල්ලීම මත මන්ත්‍රී ප්‍රතිපාදන වලින් එය ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙන ලදී.

මේ වන විට සභාව සතු භූමි කොටස් තිබෙන බැවින්ද ,සෘජු කර්මාන්ත යටතේ සභාව සතු සේවකයින්ගෙන් මේ වන විට ශ්‍රමය යොදා ගැනීමද සීමා වී ඇති බැවින් ඔවුන් යොදවා සභාවක් ලෙස වගා කරමුයැයිද ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.ගරු සභාපතිතුමාගේ යෝජනාවද ඉතාමත් හොඳ බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව වෙන්කර ඇති ඉඩම් තිබෙන බැවින් ඒවාද වල්බිහි වීඇති බවත්, ඒවා පිළිබඳව නිලධාරීන්ද දැනුවත් වී නොමැති බවත්,එබැවින් ප්‍රාදේශීය ලේකම්තුමා/තුමිය සමඟද සාකච්ඡා කොට එම ඉඩම් හඳුනාගෙන ඒවායේද වගා කිරීම ආරම්භ කරන ලෙසටද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.විශේෂයෙන්පොතුවටවන අක්කර 06ක පමණ ඉඩමක් තිබෙන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ග්‍රාමීය කමිටුව රැස්වී සාකච්ඡා කොට මේ සියල්ල තමන් වෙත ඉදිරිපත් කරන ලෙසට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

නිලධාරීන් හිතුමතේ වැඩ කටයුතු සිදු කරන බැවින් ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සම්බන්ධ වී එම වැඩකටයුතු සිදු කරන ලෙස ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

කොට්ඨාසයට වෙන් වන මුදලින් යම් මුදලක් ගන්නේ නම් කොට්ඨාසයේ එකඟතාවය මත පමණක් එය ලබා ගන්නා ලෙසට ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.

ග්‍රාමීය කමිටුවේ නායකත්වයෙන් මෙය සිදු වන බවත්, උපරිම දායකත්වය මේ සඳහා ලබාදෙන ලෙසටත් එමෙන්ම සඳුදා වන විට කෘෂිකර්ම නිලධාරීන් රැස්වන බැවින් එයට සහභාගී වන ලෙසත්,අවශ්‍ය මන්ත්‍රීවරුන්ගේ සහයෝගයද ලබා ගන්නා ලෙසටත්,ලේකම්මහතාවද එතැනට යවන බවත්, ප්‍රගතිය එකතු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.මෙය ගැටළුවක් බැවින් එයට මුහුණ දී මෙම ගැටළු වලින් වෙන්නප්පුව ආසනය ගලවා ගත යුතු බවත් එය තම ඉලක්කය බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශාල වගා බිමක් සූදානම් කර ඇති බවත්, කාබනික පොහොර ඉල්ලා ඇති බවත් ඒ පිළිබඳව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

එය ලබා දෙන බවත්, වවන ආකාරය අනුව එය නිකුත් කිරීමට දැනුම් දී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 04

රටේ පවතින ආහාර අර්බුදයට පිළියමක් ලෙස කොට්ඨාස ක්‍රමයට වගා කටයුතු කිරීම සුදුසු බවත්, ඒවා සඳහා සම්පත් යෙදවීමේදී කොට්ඨාස සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන මුදලින් අවශය මුදල ලබා ගැනීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

පසුගිය මැයි 09 වන දින සිදු වූ ඛේදවාචකයේ රූපරාමු සහ ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් රූපවාහිනියේ සිදු කල විශේෂ ප්‍රකාශය ඩිජිටල් තිරය ඔස්සේ ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

නිවෙස් බිඳ දැමූ රූපරාමු ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කල බවත්, එලෙසම වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ CCTV කැමරා පද්ධතියට සිදු කල හානිය පිළිබඳව තොරතුරු ලැබුණු බවත් ඒ වෙනුවෙන් ගන්නා පියවර පිළිබඳව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී. එමෙන්ම ඒවායෙහි දර්ශන නොමැතිදැයිද තවදුරටත් විමසා සිටින ලදී.

කඩා බිඳදැමූ රූපරාමු නොමැති බවත්,එම ස්ථානයට කීපදෙනෙකු පැමිණි බවත් ඒවා බලා ගැනීමටද නොහැකි වී ඇති බවත්, එය ඉල්ලා තිබුණද තවමත් නොලැබුණ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. කැමරාවට පහර එල්ල වී ඇති බවත්, එවිට එය කැඩී ගොස් ඇති බවත්, කීපදෙනෙකුගේ නම් ලැබී ඇති නමුත් නිවැරදි තොරතුරු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී. තමන්ට ලබා දී ඇති වාහනය ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ තිබූ බවත්, එම සිදු වීම සිදු වන අවස්ථාවේ රොබට් කෙනඩි නම් නිලධාරියා මෙම සභා පරිශ්‍රයේ රැඳී සිට තිබූ අතර මෙය රාජ්‍ය දේපලක් බවත් එයට හානි නොකරන ලෙසටද පවසා තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.

ඔවුන් පැමිණෙන විට කැමරා පද්ධතිය ක්‍රියාත්මක වෙමින් තිබුණේදැයිද, පැමිණි පුදිගලයින්ගේ රූපරාමු නොමැතිදැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.විනාශ වීමට පෙර ඒවා පටිගත වන බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මූලික විමර්ශනයක් සිදු කරන ලෙසට කොමසාරිස්තුමාටද දන්වා ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ඒ පිළිබඳව ප්‍රකාශයක් සිදු කරන ලෙස ලේකම්මහතාගෙන් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ඉල්ලා සිටින ලදී.

- ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව පසුගිය මැයි මස 09 වන දින ගරු සභාපතිතුමාගේ වාහනය සභා පරිශ්‍රය තුළ ගරු සභාපතිතුමාගේ කාර්යාලය ඉදිරිපිට නවතා තිබූ බවත්,සභාවේ CCTV කැමරා පද්ධතිය කඩා දමන දර්ශනය තිබෙන බවත් මේ වන විට සභාවේ අභ්‍යන්තර විගණන කණ්ඩායම මඟින් එය මූලික විමර්ශනයක් සිදු කරගෙන යන බවත් ප්‍රකාශ කරන ලදී. ඊට අමතරව කොමසාරිස්තුමාගෙන්ද විමර්ශන නිලධාරියෙකු හරහා මූලික විමර්ශනයක් සිදු කරන ලෙසට ඉල්ලා ඇති බවත්අදාල පටිගත වූ දර්ශන කොමසාරිස්තුමාට යවා ඇති බවත් අභ්‍යන්තර විගණන කණ්ඩායමටද ඒවා යොමු කරඇති බවත් ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධයෙන් පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් දමා නොමැතිදැයි ගරු මන්ත්‍රීවරුන් විසින් විමසා සිටින ලදී.

එම වීඩියෝ පටය සභාවේ ප්‍රදර්ශනය කරන ලෙසටද ඒ පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් දැනගත යුතු බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

එය ඊළඟ මහා සභාවේ ප්‍රදර්ශනය කරන බවත් විමර්ශනය කොට නිවැරදිව සැකකරුවන් හඳුනාගෙන එය ඉදිරිපත් කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

## **<u>03.යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

### **<u>a. ගරු සභාපතිතුමාගේ යෝජනා</u>**

i. ජල නළ බට එලීම සඳහා මාර්ග පළුදු කිරීමේදී ඇස්තමේන්තු සකස් කර තැන්පතු මුදලක් තබා ගන්නා වූ පළුදු කිරීම් සඳහා දෙපාර්ශවය අතර ඇති කර ගන්නා වූ ගිවිසුමට අදාල වන්නා වූ ගිවිසුම් පත්‍රය අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

මාර්ග ඉදි කිරීමේදී අඟල් 04 වැනි බට නොදමන්නේ මන්දැයිද දෙමටපිටිය පාර කාපට් කිරීමේදී මීටර් 200 හෝ මීටර් 500 බට එලා එය පාර කාපට් කල බවත්, මන්ද එලෙස සිදු කිරීමේදී යම් දිනක එක් පසක සිට තවත් පසකට වයර් එකක් හෝ ගෙනයාමට සිදු වේ නම් පාර කැඩිය යුතු නොවන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. මාර්ග සෑදීමේදී මෑත කාලයේදී එලෙස බට එලීම තමන් නොදුටු බවත්,මාර්ගය නැවත කෙතරම් ප්‍රතිසංස්කරණය කලද පළමු වර සෑදීමේදී එන ගුණාත්මකභාවය නැවත ගත නොහැකි බවත්, එය තමන් පෞද්ගලිකවම කටාන-මඩම්පැල්ල පාරෙන් දුටු බවත් එහි කිලෝමීටර් 2ක් පමණ වන පාරට නැවත වියදම් කර කාපට් කිරීමට සිදු වූ බවත් ප්‍රකාශ කරන ලදී. අසල්වැසියන්ගේ ගැටළු තිබිය හැකි බවත්,නමුත් පාරක් ඉදි කිරීමේදී එහි දුර අනුව මීටර් 100ක් මීටර් 150 පමණ දුර තිබේනම් ස්ථාන 2කින් හෝ අඟල් 04 බට කෑබලි 2ක් දැමුවේ නම් හොඳ බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මේ පිළිබඳව තාක්ෂණික නිලධාරීන්ව දැනුවත් කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එහිදී අමතර මුදලක් යනුයේ බට කෑබැල්ලට පමණක් බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ජල සම්පාදන මණ්ඩලය මඟින් මාර්ගය හරහා විද සම්බන්ධතාවය ලබාදෙන බවත්,සෑම ජල සැපයුමක් ලබා ගැනීමේදීම එම ක්‍රමය අනුගමනය කරන ලෙසට සියළු දෙනා දැනුවත් කරන ලෙසටද ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීවරුන්ද මෙහිදී තම අදහස් ඉදිරිපත් කල අතර එය යෝජනාවක් ලෙස ගෙනැවිත් සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා මෙහිදී දැනුම්දෙන ලදී.

පොදු ප්‍රධාන නලයක් දැමිය යුතු අවස්ථාවේදී එය අනුගමනය කරන ලෙසට ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා පැවසූ බවත්, නිවසින් නිවසට සැපයුම ගැනීමේදී සිදු කල යුතු ආකාරය ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා පැවසූ බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඇස්තමේන්තු සකස් කිරීමේදී මෙම කාරණය ඇතුළත් කරන ලෙසට මෙය කර්මාන්ත කමිටුව වෙත යොමුකිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා හොඳ බවත්, ප්‍රධාන රජයක් තිබීමේදී මෙම කටයුතු සිදු කිරීමට පහසු බවත්,රාජ්‍ය ආයතන,ටෙලිකොම් ආයතනය ජල සම්පාදන මණ්ඩලය වැනි ආයතන ඒකාබද්ධවී නොමැති බවත් මේවා එකතු කරගෙන ඉදිරියට තිබෙන ව්‍යාපෘති පිළිබඳව සාකච්ඡා කර සභාව දැනුවත් කරන ලෙසටද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.එමෙන්ම සභාව දැනුවත් නම් බට දමන ලෙස පැවසුවද එහිදි බට වල ප්‍රමාණය නොදන්නා බවත්,ආයතන එකට එකක් සම්බන්ධ වී ඉංජිනේරු සහයද ගෙන බට දැමීම සිදු කල යුතු බවත් එලෙස යෝජනා කර ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් මෙම වරද ලොකුවට සිදු වන බවත්,ප්‍රාදේශීය සභා පාරවල් වලට සිදු වන හානිය අවම බවත්, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග අසලින් අඩියක පමණ විශාල වතුර බටයක් යන බවත්, මාර්ග පළල් කිරීමේදී බටය පාර මැදට එන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. එවිට මාර්ගය හාරා ඔවුන් රු.2500ක පමණ මුදලක් ගන්නා බවත් නමුත් එය නොසාදා පස් වලින ආවරණය කර යන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.බෝලවත්ත ප්‍රදේශයේ මෙන්ම සෑම තැනම මෙය සිදු වී ඇති බවත් ලබා ගන්නා මුදලින් ප්‍රතිසංස්කරණය කරන ලෙසට එම ආයතනය දැනුවත් කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

මෙය යෝජනාවක් ලෙස ගෙන එන ලෙසත් ඉන්පසුව සභා සම්මත කර ඉදිරි කටයුතු සිදු කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ගරු මන්ත්‍රීවරුන්ද තම අදහස් ඉදිරිපත් කරන ලදී.

තීරණ අංක 05

ජල නළ බට එලීම සඳහා මාර්ග පළුදු කිරීමේදී ඇස්තමේන්තු සකස් කර තැන්පතු මුදලක් තබා ගන්නා වූ පළුදු කිරීම් සඳහා දෙපාර්ශවය අතර ඇති කර ගන්නා වූ ගිවිසුමට අදාල වන්නා වූ ගිවිසුම් පත්‍රයට අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

ii. පවතින විදුලි අර්බුදය හමුවේ වියදම් පාලනය සඳහා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සහ ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය සඳහා සූර්ය බල ශක්ති පද්ධතියක් ලබා ගැනීම වෙනුවෙන් විදුලි බල මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති නිරවුල් සහතික පිළිගැනීමටත් මෙම කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා මෙම බල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන සුනිත්‍ය බල ශක්ති අධිකාරියේ ඉංජිනේරු සනත් කිත්සිරි මහතා උපදේශකවරයා ලෙස පත් කර ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ඉදිරිපත් කරන ලදී.

✪ මේ පිළිබඳව ප්‍රගතිය හා ඉදිරි කටයුතු සම්බන්ධයෙන් ගරු මහා සභාව දැනුවත් කිරීමට විෂයභාර නිලධාරී ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතාට ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර අවස්ථාව ලබා දෙන ලදී.

සංවර්ධන නිලධාරී ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතා ගරු සභාපතිතුමා, ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් සහ ගරු මන්ත්‍රීවරියන්ගෙන් අවසර ගැනීමෙන් පසුව sola පද්ධතිය සභා පරිශ්‍රයන් තුළ ස්ථාපිත කිරීමට වසර 2කකට වැඩි කාලයක සිට උත්සාහ කල බවත්,ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ද මේ සඳහා උනන්දු වූ බවත් ප්‍රකාශ කරන ලදී. අවසාන වශයෙන් මධ්‍යම රජයත් උනන්දු කරවීම තුළ මෙය සිදු කරන ලෙසට සුනිත්‍ය බල ශක්ති අධිකාරිය විසින් ලිඛිතව දැන් වූ බවත් ප්‍රකාශ කරන ලදී. මේ පිළිබඳව විශේෂඥතාවයක් දක්වන පුද්ගලයෙකු තෝරාගෙන කිසිඳු ගෙවීමක් සිදු නොකරම එම සහයෝගය මත ස්ථාන තොරා ගත් බවත් ඒ තුළින් ආරම්භය ගත් බවත් ප්‍රකාශ කරන ලදී. ප්‍රධාන කාර්යාලය තුළ ලයින් 2ක් තිබෙන බවත්, ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය තුළ ද හොඳ ස්ථානයක් තිබෙන බවත් දංකොටුව නගර ශාලාවේද ස්ථානයක් තිබෙන බවත් මෙම ස්ථාන 4හිදී දැනට නගර ශාලාව ක්‍රියාත්මක නොවන බැවින් එම ස්ථානය දැනට පසෙකින් තබා අනෙක් ස්ථාන3හි මෙම ව්‍යාපෘතිය සිදු කරමුයැයි එම මහතා යෝජනා කල බවත් විශ්ලේෂණයක්ද ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී. ප්‍රධාන කාර්යාලයේ නව ගොඩනැගිල්ලට කිලෝවොට් 40ක්ද, පැරණි ගොඩනැගිල්ලට කිලෝවොට් 10ක්ද, ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයට කිලෝවොට් 75ක්ද වශයෙන් කිලෝවොට් 125 කිසිඳු ගැටළුවක් නොමැතිව ලබා ගැනීමට හැකි වී ඇති බවට පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී. එම කටයුත්තට මිලියන 25ක් පමණ වැය වන බවත් එහිදී වසර 2ක කාලයක ගිවිසුමකට යන බවත් ණය මුදලක් ගෙන වාරික ගෙවා ගෙන වසර 06ක් යන විට මෙය සම්පූර්ණයෙන්ම ශුද්ධ අයිතියට පත් කර ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී. එය විශාල ආයෝජනයක් බවත්, 7 වන වසරේ සිට වසර 20ක් දක්වා වසර 14ක කාලයක් ඇතුළත ශුද්ධ ආදායමක් ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී. මෙහිදී net accounting system එකක් ලබා ගන්නා බවත් එහිදී සිදු වනුයේ භාවිතා වන ඒකක ගණන ඔවුන් අඩු කරගෙන ඉතිරියට ඔවුන් මුදල් ගෙවන බවත් ඉදිරියේදී වැඩි වන විදුලි බිලත් සමඟ මෙය සභාවට වාසිදායක බවත් ඉතිරි වන ඒකක ගණනට ඒකකයට රු.22 බැගින් වසර 7ක් ගෙවීමක්ද සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී. ඉන්පසුව රු.15 බැගින් ගෙවීම් කරන බවත් එහිදී ගැටළුවක් නොවන බවත් ලාභයක්ද ලැබෙන බවත් අපට ලැබෙන ලාභයටත් වඩා ජාතික ප්‍රතිපත්තියක් ලෙස මෙය වැදගත් බවත් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී අවාසියක්ද සිදු වී ඇති බවත් 4% පොළියට ලබා දුන් බැංකු ණය අපට අහිමි වී ගිය බවත් එමෙන්ම sola power system එකද 100% කින් මිල වැඩි වී ඇති බවත් සංවර්ධන නිලධාරී ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතා ප්‍රකාශ කරන ලදී.මධ්‍යම රජයද මේ සඳහා මැදිහත් වන බැවින් දේශීය ණය සංවර්ධන අරමුදලින් මෙම ව්‍යාපෘති සඳහා ණය ලබාදීමට සූදානම් බව පවසා ලිපියක්ද ලැබී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ඒවා සඳහා LLDF ලෙස වෙනම ආයතනයක් පිහිටුවා ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.ඒ මඟින් ණය ලබා ගත හැකි බවත් 7% හෝ 7.5% පොළී අනුපාතයට එය යන බවත් මෙය විශේෂ ව්‍යාපෘති බැවින් සාකච්ඡා කොට පොළී අනුපාතය අඩු කිරීමටද සාකච්ඡා කරන බව පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.

ඊළඟ පියවර නම් විදුලි බල මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගැනීම බවත්, ඔවුන්ගේ අනුමැතියද ලැබුණු බවත් කිලෝවොට් 50 ලබාදිය හැකි බවට පැවසූ බවත්, ක්‍රීඩාංගණය සඳහා කුලියාපිටිය කාර්යාලයෙන් අනුමැතිය ලැබෙන බැවින් එයද ඊයේ දිනයේදී කුලියාපිටියට යැවූ බවත් සංවර්ධන නිලධාරී ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතා ප්‍රකාශ කරන ලදී. තම මිතුරෙකු මාර්ගයෙන් එයද ඉක්මනින් ලබා ගැනීමට කටයුතු කරන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම සුනිත්‍ය බලශක්ති අධිකාරි විදුලි ඉංජිනේරු මහතෙකුගේ උපදෙස් ලබා ගත් බවත්, එතුමා නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් එක ඉදි කිරීමේදීද සහය ලබා දී ඇති බවත්, එතුමා සමඟද සාකච්ඡා කොට ඇති බවත් තාක්ෂණික නිලදාරීන්ට අමතරව ඇගයීම් කමිටු සාමාජිකයෙකු ලෙස එතුමාවද පත් කර ගැනීමට සූදානම් වී සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

මෙය අත්‍යවශය බවත් හැකි ඉක්මනින් මෙය සිදු කරන ලෙසත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එතුමාව සභාවට හඳුන්වා දෙන ලෙස ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා ඉල්ලා සිටින ලදී.

ලබන මහා සභාවට එතුමාව ගෙන්වමුයැයි ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

මෙහි ප්‍රගතිය ලබන මුදල් කමිටුවට ලබා දෙන ලෙසට ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ඉල්ලා සිටින ලදී.

මෙම යෝජනා මීට වසර 4කට පෙර මහා සභාවට ගෙනා බවත්, සැමදාම කතා කල බවත් කිලෝවොට් 150ක ධාරිතාවයක් තිබෙන වහලයක් සබාවට තිබෙන බවත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයේ කිලෝවොට් 200-350 පමණ උත්පාදනය කල හැකි වහලයක් තිබෙන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ස්වභාවික විපත් තිබෙන බැවින්ද වසර 7ේ ගිය විට පැනල් වල නිෂ්පාදන ධාරිතාවය අඩු වන බැවින්ද මෙම පද්ධතිය 100% රක්ෂණය කල යුතු බවත් කෙසේ නමුත් මෙම කාර්යය ඉතාමත් කඩිනමින් සිදු කරමුයැයිද මෙය දේශීය අවශ්‍යතාවයක් බවද ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 06/i

පවතින විදුලි අර්බුදය හමුවේ වියදම් පාලනය සඳහා ප්‍රධාන කාර්යාල ගොඩනැඟිල්ල සහ ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය සඳහා සූර්ය බල ශක්ති පද්ධතියක් ලබා ගැනීම වෙනුවෙන් විදුලි බල මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති නිරවුල් සහතික පිළිගැනීමටත් මෙම කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා මෙම බල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන සුනිත්‍ය බල ශක්ති අධිකාර්යා ඉංජිනේරු සනත් කිත්සිරි මහතා උපදේශකවරයා ලෙස පත් කර ගැනීමටත් සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

තීරණ අංක 06/ii

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය සහ ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය සඳහා

ස්ථාපිත කිරීමට යෝජිත සූර්ය බල ශක්ති පද්ධති සඳහා දේශීය ණය සංවර්ධන අරමුදල (LLDF ) යටතේ ණය පහසුකම් ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

iii. සේවා ගිවිසුම් පදනම මත සේවයේ යෙදී සිටින සේවක මහත්ම මහත්මීන් 30 දෙනෙකුගේ සේවා කාලය දීර්ඝ කිරීමට අදාලව මහා සභා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ඉදිරිපත් කරන ලදී.

පවතින කොල හැගතාවය මත මෙම යෝජනා මන්ත්‍රීවරුන්ට ලබානොදුන් බව ද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

දංකොටුව සතිපොළ භූමියේ කසල පිරිසිදු කිරීමට කටයුතු නොකරන බවත්, අත්‍යවශ්‍ය සේවා සඳහා තෙල් කලමනාකරණය කර ගැනීමට සභාවට කලමනාකරණයක් තිබිය යුතු බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

මේ තරම් කාලයක් ගැටළුවක් නොතිබුණ බවත්, ගිය මසද අපට ප්‍රමුඛස්ථානය ලබා දුන් බවත් අප එක් ස්ථානයකින් පමණක් තෙල් ලබාගත් බවත් නමුත් මේ වන විට ඉල්ලුම පරිදි තෙල් ලබා නොදෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. එමෙන්ම තමන් මේ පිළිබඳව සොයා බැලූ විට ඇටියාවල සහ බෝතලේගම යන ස්ථාන වලින් තෙල් ලබා ගැනීමට සූදානම් වී සිටින බවත් උපකාර්යාල වල තිබෙන වාහන සඳහා එම ස්ථාන වලින් තෙල් ලබා ගත හැකි බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

වෙන්නප්පුව ආසනයේ කොපමණ පිරවුම්හල් තිබේදැයිද ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා විමසා සිටින ලදී.

පිරවුම්හල් 13 තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් එක් ස්ථානයකින් ලීටර් 100 බැගින් ගත්තද ලීටර් 1300 ලැබෙන බවද ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් දංකොටුව ප්‍රැන්සිස් මහතාගේ පිරවුම්හලින් තෙල් ලබා ගැනීමට පසුගිය දිනක කතා කල බවත්,නමුත් රටේ පවතින වාතාවරණය මත ජනතා විරෝධයක් පැමිණේයැයි බියෙන් ඔවුන් තෙල් තෙල් ලබා දීම ප්‍රතික්ෂේප කල බවත්, එහිදී තමන් පොලීසිය සමඟ කසල පිරවූ ට්‍රැක්ටර් එථ දෙකක් එවන බව පැවසූ විට එයට ඔහු කැමති වුවද ඒ වන විටත් තෙල් ගැසීම ආරම්භ කර තිබූ බැවින් පොලීසිය වෙනත් ආරවුලක් විසඳා යන විටත් තෙල් අවසන් වී තිබූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.කසල පිරවූ ට්‍රැක්ටර් 2ක තිබුණද ජනතාව එයට තෙල් ගැසීමට ඉඩ ලබා නොදුන් බවත්, සභාව මඟින් සිදු කරන සේවය පිළිබඳව ජනතාවට අදහසක් නොමැති බවත් ගරු සභාපතිතුමා තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

සියළුම දෙනා එකලෙස නොසිතන බවත්,මේවා සඳහා ක්‍රමවේදයක් සකස් කල යුතු බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

පිරවුම්හල් අයිතිකරුවන් මේ වන විට බියෙන් සිටින බවත්, ප්‍රාදේශීය සභාව අත්‍යවශ්‍ය සේවා යටතේ නොමැති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම ඉදිරිපත් කර තිබෙන සේවා කාලය දීර්ඝ කිරීමේ යෝජනාවට තමන් විරුද්ධ බවද ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 07/i

සේවා ගිවිසුම් පදනම මත සේවයේ යෙදී සිටින ඇමුණුම 01හි සඳහන් සේවක මහත්ම මහත්මීන් 30 දෙනෙකුගේ සේවා කාලය මාස 06කින් දීර්ඝ කිරීම සුදුසු බවට **ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සඳහා ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා විරුද්ධත්වය දන්වා සිටින ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ බහුතර අනුමැතිය ලබා දෙන ලදී.**

තීරණ අංක 07/ii

පවතින වර්තමාන ඉන්ධන අර්බුදය හමුවේ දැනට ලබා ගන්නා සී/ස වෙන්නප්පුව සමූපාකාර සංගමයේ ඉන්ධන හලට අමතරව වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා බෝතලේගම සහ ඇටියාවල යන පිරවුම්හල් වලින්ද අවශ්‍ය අවස්ථාවේදී ඉන්ධන ලබා ගැනීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

iv. සභාව සතු දකුණු කම්මල පිහිටි රූඩ් 01 පර්චස් 35.20 විශාල ඉඩම වර්ෂ 10කට වැඩි කාලයක් සඳහා බදු ලබා ගැනීම පිණිස නො.57, ද/කම්මල,වයික්කාල යන ලිපිනයේ පදිංචි වර්ණකුලසූරිය ඉසංක සඳරුවන් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය සලකා බලන ලදී.

එම ඉඩමේ ප්‍රමාණය පිළිබඳව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

එම ඉඩමේ රූඩ් 01 පර්චස් 35.20 ප්‍රමාණයක් තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව සඳහා අනුමැතිය ලබා දිය නොහැකි බව ගරු මන්ත්‍රීවරුන් පවසා සිටින ලදී.

මේ සම්බන්ධව ඉල්ලීම ලේකම්ට ලබා දී ආදායම් පරීක්ෂක වාර්තාවක් ගන්නා ලෙස ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ටෙන්ඩර් ක්‍රමයට යා යුතු බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

ඒ සියල්ලටම පෙර මෙම ඉඩම මැන කම්බි ගසා වෙන්කරගන්නා ලෙසත්,විශාල වෙළඳ වටිනාකමක් තිබෙන ඉඩමක් බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය නැවත මනිමුයැයි ගරු සභාපතිතුමාද යෝජනා කරන ලදී.

සභාවේ ඉඩම් වලට පුවරු ගසන ලෙසට දීර්ඝ කාලයක පටන් පැවසූ බවත් ඒ පිළිබඳව ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා විමසා සිටින ලදී.

ඒ සඳහා විශාල මුදලක් වැය වන බැවින් සාමාන්‍ය පුවරු වල ඒවා ලියා අදාල ද්බාන වල ප්‍රදර්ශනය කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සියළුම ඉඩම් වල එලෙස සිදු කරන ලෙසට ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහි ඉදිරි කටයුතු සඳහා පොදු පහසුකම් කමිටුවට යොමු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරන අංක 08

මෙම සභාව සතු සංචාරක හෝටල් ආසන්න ප්‍රදේශයේ පිහිටා ඇති වටිනා ඉඩමක් බැවින් එය බදු ලබා නොදිය යුතු බවත්,එම ඉඩම මිනුම් කර කම්බි ගසා ආරක්ෂා කල යුතු බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී

## <u>04. කාරක සහා වාර්තා සලකා බැලීම.</u>

i. 2022.03.29/2022.04.29 සහ 2022.06.02 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සලකා බැලීම

2022-03-29 වන දින වාර්තාවේ 03 වන පිටුවේ ඇති මාර්ග ලැයිස්තුවේ බ/ලුණුවිල පොදු සුසාන භූමිය ඇතුළත මාර්ගය සංවර්ධනය කිරීම ලෙස සඳහන් වන බවත්,නැවත එය සොයා බලන ලෙසත් බටහිර ලුණුවිල පොදු සුසාන භූමියක්ද නොමැති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචායක මහතා ප්‍රකාශ කරන ලදී.එය මැ/ලුණුවිල වන්නට ඇතැයි තමන් සිතනා බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

2022-04-29 වන දින වාර්තාවේ 2වන පිටුවේ 03 වන අංකය යටතේ කිරිමැටියාන ශ්‍රියානි මංගලිකා ක්‍රීඩාංගණයේ ප්‍රධාන ගේට්ටුවේ ආරුක්කු නාම පුවරුව ප්‍රාග්ධන ඉදිකිරිමක් වන බැවින් ඒ සඳහා විධිමත් ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරි කටයුතු සිදු කළ යුතු බව ලේකම් මහතා විසින් පෙන්වා දෙන ලදුව ඒ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදි ලෙස සඳහන් වන බවත් මෙම ඉදි කිරීම් කටයුතු ඇස්තමේන්තුවක් නොමැතිව සිදු වී ඇති බවට තේරුම් යන බවත් ඒ පිලිබඳව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදි.

මහා සභාවේදීද මේ පිළිබඳව සාකච්ඡා කල බවත්, එම ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුවට යොමු කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී සඳහන් වී ඇති දෙය පිළිබඳව තමන් විමසා සිටින බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

එය ප්‍රාග්ධන ඉදි කිරීමක් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම අංක 04 යටතේ පොළී අනුපාතය පිළිබඳව විස්තරයක්ද ලබා දී ඇති බවත් දැනට සභාවේ නිදහස් කර ගන්නා මුදල පිළිබඳව සඳහනක් නොමැති බවත්, තරන්පත් කල මුදල පිළිබඳවද විස්තරයක් ලබාදෙන ලෙසත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

සියළුම ස්ථාවරතැන්පතු වල කෝටි 07 පමණ තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එමඟින් කෝටි 05ක් නිදහස් කරගන්නේදැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටි අතර මේ පිළිබඳ තොරතුරු ඉදිරි පත් කිරිමට ලේකම් මහතාට අවස්ථාව ලබා දෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මුදල් කමිටුව මඟින් පොළී අනුපාතය අඩුවෙන් දමා තිබූ එක්කෝටි 4 ½ක මුදලක් නැවත වැඩි පොළී අනුපාතයක් යටතේ තැන්පත් කිරීමට තීරණය ගත් බවත්, එහිදි පෙර තැන්පතුවෙන් ලද ලක්ෂ 50ක පොළියද එකතු කර කෝටි 5ක මුදලක් තැන්පත් කිරීමට හැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී.

දැනට ස්ථාවර තැන්පතු මුදල කොපමණදැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

මෙම කෝටි 5 හැරතවත් කෝටි 3ක මුදලක් ගෙවීම් කිරීමට නිදහස් කරගෙන තිබූ බවත්,මුද්දර ගාස්තු ලැබුණු පසුව 2022-06-02 වන දින මුදල් කමිටුවේ අනුමැතියෙන් නැවත කෝටි 2ක මුදලක් තැන්පත් කල බවත්මේ වන විට කෝටි 7ක් තැන්පත් කර තිබෙන බවත් ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී මාස 3ක් සඳහා තැන්පත් කරනුයේ මන්දැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

එලෙස මාස 03කට තැන්පත් කරනුයේ හදිසි අවස්ථාවකදී නිදහන් කර ගැනීමට බවත්,එය ජංගම ගිණුමේ තිබී ස්ථිර ගිණුමකට මාරු කල බවත් මුදල් කමිටුවේ තීරණ ගෙන මෙම කටයුතු සිදු කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

2022-06-02 වන දින වාර්තාවේද සෙන්දිරියාමුල්ල කොම්පෝස්ට් අංගණය පිළිබඳව සඳහන් වන බවත්,එහි ප්‍රගතිය සම්බන්ධයෙන් තවමත් දැනුවත් වී නොමැති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. දැනට ඉදි කිරීම් තත්ත්වය, වර්තමානයේ ඉදි කිරීම් සිදු කරගෙන යන්නේද,මෙතෙක් වියදම් වූ මුදල අමාත්‍යාංශයෙන් ලැබී තිබේද යන්න පිළිබඳව දැනුවත් වී නොමැති බවත්,මන්ද තවත් ලක්ෂ 25ක මුදලක් ගෙවීමට මුදල් කමිටුවේ අනුමැතියද ලැබී ඇති බවත් මෙතැනින්ද මෙම ඉදි කිරීමඅවසන් වන්නේ නැතිනම්ද මෙතෙක් සිදු කල මුදල ප්‍රතිපූර්ණය වී නොමැති නම්ද තවත් ලක්ෂ 25කොන්ත්‍රාත්කරුට ගෙවූ විට සභාව හිර වන බවද ප්‍රකාශ කරන ලදී. මේ වන විට තමත් අත්‍යවශ්‍ය වැඩ තිබෙන බවත්,පුස්තකාල වල පත්තරද නොමැති වත් ඒ පිළිබඳව තමන් ප්‍රජා කමිටුවේ සභාපති ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාටද කතා කල බවත් එවැනි තත්ත්වයක් තිබියදී කොන්ත්‍රාත්කරුගේ මුදල පියවීමට වඩා ගෙවූ මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට උත්සාහ කරමුයැයිද එසේත් නොමැති නම් මෙම වැඩ තාවකාලිකව නවතා අත්‍යවශ්‍ය දේ සිදු කරමුයැයිද යෝජනා කරන ලදී.

කොම්පෝස්ට් අංගණය සඳහා රුපියල් දෙකෝටි තිස් ලක්ෂයක මුදලක් පලාත් පාලන අමාත්‍යාංශයෙන් වෙන් වූ බවත්,ඝණ අපද්‍රව්‍යය ඒකකයේ ඉංජිනේරුමහතා මෙම ඉදිකිරීම් කරගෙන යන ලෙසත් මුදල් ලබාදෙන බව පැවසූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මේ පිළිබඳ සාකච්ඡාවට හෙට දින ලේකම්වරුන්ගේ රැස්වීම තිබෙන බැවින් සභාවේ ලේකම්මහතාද එයට සහභාගී වන බවත්, වැසිකිළි පද්ධතිය සහ කාර්යාලය සැකසීමට තිබූ මුදල් මේ වන විට පාස් වීඇති බවත් ඒවාද ලබන සතිය වන විට ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම මෙම වැඩ කටයුතුසිදු කරගෙන යන ලෙසට පවසා ඇති බවත්,මේ වන විට කොම්පෝස්ට් පොහොර අංගණය කාලීන

අවශ්‍යතාවයක් බවට පත් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.යකඩ තිබෙන බැවින් වහලය ගසා කොන්ක්‍රීට් දමා පොහොර සෑදීමට පටන් ගන්නා ලෙසට තමන් පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.

ඇස්තමේන්තුවට වැඩ කටයුතුසිදු වන බවත්,එවිට සිදු කරන නොකරන දෑ නමින් පැවසූ විට ඇස්තමේන්තුවට හා ප්ලෑන් එකට කුමක් සිදු වේදැයිද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

මිල වැඩිවීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුහා සාකච්ඡා කොට එය සභාව පසින් ගෙවන ලෙසත්,ඔවුන්ගේ දෙකෝටි තිස් ලක්ෂය අනිවාර්යයෙන්ම අපට ලබාදෙන බව පැවසූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මැයි 09 වන දින ප්‍රශ්නය සිදු වූ අවස්ථාවේදී තමන් වෙනත් නිවසක රැදී සිටියදී යකඩ ආරක්ෂා කර ගැනීමට නොහැකි බව පවසා අසල්වැසි පුද්ගලයා දුරකථන ඇමතුමක් දුන් බවත්, එය අවධානම් තත්ත්වයක් බැවින් එය ගෙන න ලෙසටද ඔහු පැවසූ බවත් ඉන්පසුව තම ප්‍රශ්නය පසෙක දමා තමන් එම යකඩ ආරක්ෂිත ස්ථානයකට ගෙන යන ලෙසට ලේකම්මහතාට පැවසූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.එම යකඩ මේ වන විට කිරිමැටියාන උප කාර්යාලය තුළ ආරක්ෂිතව තිබෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. මෙම ඉඩම අප සභාව මඟින් ලබාගෙන නොතිබුණේ නම් මේ වන විට කැබලි කඩා විකුණා ඇති බවත් මේ වන විට කොම්පෝස්ට් අංගණය ඉදි කිරීම ආරම්භ කර ඇති බැවින් හැකි ඉක්මනින් මෙම වැඩ කටයුතු අවසන් කර එහි වැඩ කටයුතු ආරම්භ කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.දිනකට කසල ට්‍රැක්ටර් රථ 17 පමණ එකතු වන බවත් ට්‍රැක්ටර් 5ක් පමණ කිරිමැටියාන කොම්පෝස්ට් අංගණය වෙත ගෙන ගොස් දමා ඉතිරිය පෞද්ගලික කොම්පෝස්ට් සාදන පිරිසට ලබාදෙන බවත් එයිනුත් ඉතිරිය වලලා දමන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මේ වන විට පොහොර ආදායම ලක්ෂ 3ක් 4ක් පමණ වන බවත් මෙම කොම්පෝස්ට් අංගණය ලබන මස විවෘත කලහොත් ලැබෙන ආදායම වැඩි වන බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම කටයුත්ත ඉතාමත් හොඳ බවත්,මෙය අවසන් කරගත යුතු බවත් එක්කෝටියක වැඩ ගිය වසරේ අවසන් කල බවත් මේ වන විට මුදල් කොපමණ ලැබී තිබේදැයිද ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා විමසා සිටින ලදී. ගිය වසරේදී කාර්යක්ෂමව වැඩ කටයුතු කල බවත් නමුත් මේ වන විටත් කිසිඳු මුදලක් ලැබී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.මෙය පෞද්ගලික කටයුත්තක් නොවන බවත්,කොන්ත්‍රාත්කරුවෙකුට මෙය භාර දී ඇත්නම් ගරු සභාපතිතුමා යකඩ ආරක්ෂා කිරීමට ගියේ මන්දැයිද විමසා සිටින ලදී.

සභාවේ භූමිය තුළ යකඩ ගෙනැවිත් දැමූ බවත්, ඇස්තමේන්තුවේ එයටත් සමඟ මිල ගනන් කැඳවාඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඕනාවටත් වඩා සිතිය යුතු නොවන බවත්, ඉදි කිරීම් සිදු කරන කොන්ත්‍රාත්කරුට එය සිදු කිරීමට නොහැකි නම් නැවත ටෙන්ඩර් කැඳවන ලෙසත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී. ලක්ෂ 100 ලැබී නොමැති බවත්, මෙහිදී තම විරෝධතාවයද ප්‍රකාශ කරන බවත් සඳහන් කරන ලදී. ඇස්තමේන්තු ප්‍රමාණය,සිදු කර අවසන් ප්‍රමාණය,ගෙවා ඇති ප්‍රමාණය, ගිවිසුම් වල පිටපත් ඉදිරිපත් කරන ලෙසද ඉල්ලා සිටින ලදී.

ලිපි ගොණුවේ සියළුම විස්තර තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය අමාත්‍යාංශයකින් ලැබෙන මුදල් බවත්, මෙය සභාවේ පොදු අරමුදල් නොවන බවත්, අමාතංශයේ මුදල් ලැබෙන බව පැවසුවද මෙසේ වැඩ කටයුතු සිදු නොකල යුතු බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී. ගෑස්,ඉන්ධන නොමැති බවත් ඒවා ලබා දීමට අපට නොහැකි බවත් තම අදහස නම් අමාත්‍යාංශය තුළින් මෙම මුදල නොලැබේ නම් මෙය ප්‍රමාද කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.මහ බැංකු අධිපතිතුමාද අවශ්‍යතා වසර 10කට කල් දමනා ලෙස පැවසූ බවත්, එබැවින් මේ සඳහා පෞද්ගලික මුදල් අවශ්‍ය නම් යොදවන ලෙසත් වැඩ නිම කල කොටසේ ලක්ෂ 100ක ගෙවීම් වාර්තා යැවුවද තවමත් කිසිඳු මුදලක් ලැබී නොමැති බවත් තමන්ද රජයේ සේවකයෙකු ලෙස මෙම ගන්නා පරිපාලනයේ තීන්දු මොනවාදැයි නොදන්නා බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.පොදු අරමුදල් භාවිතා කරන්නේ නම් 50%ක මුදලක් ලැබුණු පසුව සිදු කරමුයැයිද,ලක්ෂ 48 හෙට දන රැස්වීමෙන් පසුව ගෙවන්නේ නම් සහ තවත් වැඩ කොටසක් අවසන් කර ඇත්නම් මෙම ලක්ෂ 25 වෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

රටේ ප්‍රශ්නයක් නොතිබුණ බවත්, දෙසැම්බර් ජනවාරි වන විට මුදල් දෙන ලෙසට ඔවුන් පවසා තිබූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය රජයේ නීතිරීති වලට සම්පූර්ණයෙන් පටහැනි තීන්දුවක් බවත් ලේකම්තුමාට විරුද්ධවද පැමිණිලි කරන බවත්,මෙලෙස සිදු කිරීමට කිසිදු හැකියාවක් නොමැති බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.ගිවිසුමේ වගන්ති සභාවට ඉදිරිපත් කරන ලෙසටත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගිවිසුම අනුව මුදල් ගෙවීමට සභාව බැඳී සිටින බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තමන්ම මෙය මීන් පෙරද මහා සභාවේ කතා කල බවත්, දික්වෙල වතුර මෝටරයක් ලක්ෂ 5ක මුදලකට දෙසැම්බර් මස සවිකල බවත්, එම මුදල පෙරේදා දින ලැබුණ බවත් එහිදී සභාවෙන් මුදල් ගෙවා පසුව ලැබෙන මුදල ලබා ගැනීමට කටයුතු නොකල බවත් මෙතැන ජේෂ්ඨ මන්ත්‍රීවරුන්ද සිටින බවත් තමන් එදින මුදල් කමිටුවේ සිටියේ නම් පැහැදිලිවම මෙයට විරුද්ධ වන බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ළදී.ලක්ෂ 48 ගෙවා ඇති බැවින් එම මුදල අමාත්‍යාංශයෙන් ගෙන එය ලැබුණු පසුව ඉතිරි ලක්ෂ 25 ගෙවන ලෙසද ප්‍රකාශ කරන ලදී.

මෙම වැඩකටයුතු නතර නොකර සිදු කරගෙන යා යුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

රටේ අයවැයෙහිද බොරු ඉලක්කම් තිබූ බවත්, මෙතැනද බොරු ඉලක්කම් තිබෙන බවත් මෙහිදි කරපු ප්‍රමාණයට සමාන ගෙවීමක් ලක්ෂ 25 ගෙවීම තුළින් අවසන් වන බවත් ලක්ෂ 48 සහ ලක්ෂ 25 එකතුව දැනට නිමවූ ප්‍රමාණයට සමාන වන බවට තමන් සිතනා බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී. ඇස්තමේන්තු,ගිවිසුම් පත්‍රය,වැඩ නිමකල වාර්තාව,ගෙවපු ප්‍රමාණය සභාවට ඉදිරිපත් කරන ලෙසට ද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙය සිදු කිරීමට නොහැකි නම් ගිවිසුමෙහි සඳහන් වේ නම් කොන්ත්‍රාත්කරුට ඉන් ඉවත් වන ලෙසට පවසන ලෙසත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී. මුළු වටිනාකම ලක්ෂ 230ක් බවත්, මෙය සිදුකල යුතු කාල සීමාවක් තිබෙන බවත්, මුදල් ගෙවීම් සිදු කරන වගන්තිද ගිවිසුමේ ඇතුළත් බවත්, වැඩබිම ආරක්ෂා කරගත යුතු කොන්දේසිද එහි ඇතුලත් වී ඇති බවත්, වැඩ ඉවර වී මුදල් ලබාදෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී. රටේ තත්ත්වය අනුව මෙම ලක්ෂ 230 අද හෙට නොලැබෙන බවත්, මීට වඩා ප්‍රශ්න තිබෙන අවස්ථාවක මෙවැනි දෑ නොකරන ලෙසටද ඉල්ලා සිටින ලදී.

නව අයවැයක් ඉදිරියේදී එන බවත්, එවිට ඉදි කිරීම් වලට මුදල් නොලැබී යන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය සණ අපද්‍රව්‍ය සඳහා වෙන්කර තිබූ මුදලින් ලැබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම මුදල වෙන් කර තිබෙනවා දුටුවේදැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ගරු සභාපතිතුමාගෙන් විමසා සිටින ලදී.

හෙට දින සාකච්ඡාවට යනුයේ ඒ සඳහා බව ගරු සභාපතිතුමා ප්‍රකා කරන ලදී.

මෙම අර්බුදය රටේ ඇති වීමට පෙර මෙම සියළු කතා නිවැරදි බවත්,අමාත්‍යාංශ ලේකම්ට කතා කර එය සිදු කර ගැනීමට හැකියාව තිබූ බවත් නමුත් මෙ වන විට අමාත්‍යාංශ වල තිබෙන සියළුම මුදල් භාණ්ඩාගාරයට ගෙන ඇති බවත්, පඩි ගෙවීමද මුදල් අච්චු ගසා සිදු කරන බවත්, එබැවින් මෙම ඉදි කිරීම් සඳහා මලියන ගණනක මුදල් ගෙවනු ඇතැයි සිතන්නේදැයිද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

මෙම ඝන අපද්‍රව්‍ය මධස්ථානය සෑදිය යුතු නොවේදැයිද ගරු සභාපතිතුමා විමසා සිටින ලදී.

ඝෝෂාව......

මෙම මුදල් වර්ෂය අවසානයේ නොපැමිණියේ නම් ගලපන්නේ කෙසේදැයිද ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා විමසා සිටින ලදී.

මේ පිළිබඳව පරිපාලනය පසින් පැහැදිලි කිරීමක් කරන ලෙසට ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ලේකම්මහතාගෙන් ඉල්ලා සිටින ලදී.

කිරිමැටියාන කාබනික පොහොර අංගණය ඉතාමත් අපහසුවෙන් සිදු කරන බවත්, ඉතාමත් මහන්සි වී ඉඩමක් ගැනීම තුළ සභාවේ වත්කම්ද වැඩි වී ඇති බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඉඩම තවමත් ලබා දී නොමැති බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

සංවර්ධන වැඩ කටයුතු කරගෙන යාමට අවසර ලබා දී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඉදිරියේදී එම ඉඩම නීත්‍යානුකූලව ලබා ගැනීමට හැකි බවත්, වරිපනම් සීමා පුළුල් කිරීම තුළ සේවා සපයන ආයතනයක් ලෙස කසල එකතු කිරීමටද සිදු වන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. කිරිමැටියාන පොහොර අංගණය පසුගිය කාලයේ ලාභ නොලැබුවද එය වර්ධනය කර මේ වන විට ලාභ ලබන බවත්, එමඟින් කොවිඩ්-19 සමයේ කාබනික පෙහොර විකුණා සභාවේ මාසික නඩත්තුව සිදු වූ බවත් ප්‍රකාශ කරන ලදී. රැස්වන කසල පොහොර සෑදීම සඳහා ස්ථානයක් අවශ්‍ය බවත්, එම නිසා සභාවේ අරමුදල් හෝ භාවිතා කර මෙම ඉදි කිරීම සිදු කිරීම මෙම අවස්ථාවට කාලෝචිතයැයි තම මතය බවත්, කිසි දිනක සභාවට අගතියක් සිදු වන යෝජනා කර නොමැති බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී. මෙය අප ආයතනයට සහ රටට අවශ්‍ය දෙයක් බැවින් ඒ සඳහා අවධානය යොමු කරන ලෙසත් ක්‍රමවේදයේ අඩුපාඩු තිබේ නම් මැදිහත් වී එය නිවැරදිව විසඳන ලෙසද ලේකම්මහතාට දැනුම් දෙන ලදී. සභාව මඟින් කසල එකතු කර පිට මිනිසුන්ට නොමිලයේ පෙහොර සෑදීමට ලබාදෙන බවත් මේ සියල්ල සිතා බලා මෙම පොහොර අංගණය ඉතාමත් ඉක්මනින් සිදු කරන ලෙසටද ප්‍රකාශ කරන ලදී.

සෝෂාව......

තමන් හා හිටපු විපක්ෂනායකතුමා මෙම ඉඩම ලබා ගැනීමට ඉතාමත් මහන්සි වූ බවත්,මෙය සිදු කල යුතු බවත් නමුත් පළමුව මෙහි ක්‍රමය සාදා ගන්නා ලෙසත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහි මුදල් කිසිවක් ලැබී නොමැති බවත්, තමන් පසුගිය දින වල කණු තෙමීයන බව දුටු බවත්,කසල සියල්ල සෑම දිනම ගෙන ගොස් වියදම් කර බොරළු දමා වසා දමන බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී. මෙය ඉදි කල යුතු දෙයක් බවත්, ක්‍රීඩාංගණ සඳහා ඉඩම් මිලදී ගත් බවත්, ලිහිරියාගම පොළද කෝටි ගණනක් ඉදි කර සකස් කල බවත්, ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතාගේ කොට්ඨාසයේද ඉදි කිරීම් සිදු කල බවත් මේවාට කිසිවෙකු විරුද්ධ නොවුන බවත් ප්‍රකාශ කරන ලදී. මේ වන විට කසල අංගණය කාලීන අවශ්‍යතාවයක් වී ඇති බවත්, මේ තුළින් අතිදැවැන්ත මුදලක් උපයාගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී.කොන්ත්‍රාත්කරුට පසුගිය දිනවල මන්ත්‍රීවරයෙකුද කතා කර ඇති බවත්, මෙම කසල අංගණයට මන්ත්‍රීවරුන් විරුද්ධ වීම වැරදි බවත්, ප්‍රතිලාභයක් ලැබෙන මෙම අංගණය ඉදි කරන ලෙසත් තම මන්ත්‍රී ප්‍රතිපාදනද ඒ සඳහා ලබා දීමට තමන් සූදානම් බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

පොලවල්,ක්‍රීඩාංගණ සියල්ල සභාවේ මුදලින් සෑදූ බවත් මෙය අමාත්‍යංශය මඟින් ලැබෙන දෙයක් බවත් මෙහි නීතිමය තත්ත්වය පවසන ලෙසත්, මේ සඳහා විරුද්ධතාවයක් නොමැති බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

ලැබෙන මුදලක් ගනිමුයැයිද,මෙය ඉදි කර අවසන් කරමුයැයිද ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

සෝෂාව......

මෙහිදී අදහස් ගණනාවක් ඉදිරිපත් වූ බවත්,පරිපාලනය පසෙන් බලන විට විශාල අභියෝගයක් තිබෙන බවත්,අප සිතාගෙන සිටින දෑ සභාව තුළ කිරීමට හැකිවේදැයි කිසිවෙකු නොදන්නා බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.මෙය සභාවේ ප්‍රාග්ධනයේ විශාල අවශ්‍යතාවයක් බවත්, සියළු දෙනාම එකාමෙන් එකතු වී මෙය සිදු කරමුයැයිද,ස්ථාවරයක සිටිමින් මේ සඳහා අවසරය ලබාදුන් බවත්,කාලීන අවශ්‍යතාවයක් බවත් ප්‍රකාශ කරන ලදී. මෙය සිදු කරගෙන යාමේදී විවිධ ප්‍රායෝගික ගැටළු මතු වූ බවත්,ඒවා වැළැක්විය නොහැකි බවත්, මේ වන විට තත්ත්වය අනුව මැත කාලයේදී එම කිසිදු මුදලක් නොලැබෙන බවත් නමුත් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට වත්කම් තිබෙන බවත්, ඉතාමත් අපහසුවෙන් එම ඉඩම ලබා ගත් බවත් ප්‍රකාශ කරන ලදී. මෙවැනි අක්කර 04 ඉඩම් ප්‍රමාණයක් තුළ රටේ කාලීන අවශ්‍යතාවයක් වී ඇති මෙම ක්‍රියාවලිය සිදු කිරීමට අප වාසනාවන්ත වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතාද, ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතාද පැවසූ සියල්ල 100%ක්ම නිවැරදි බවත්, මෙය සෑම විටම ඔප්පුවක් මඟින්ලැබී තිබේදැයි තමන් විමසූ බවත්, මෙය වාචිකව ලැබී ඇති බව ගරු සභාපතිතුමා පැවසූ බවත් රාජ්‍ය පරිපාලනය තුළ වාචිකව කටයුතු කල නොහැකි බවත් නමුත් අවසර ලිපියක් තිබෙන බැවින් මෙය කරගෙන යමුයැයි මුදල් කමිටුවේදී තීරණය කල බවත් ප්‍රකාශ කරන ලදී.සභාවේ මුදල් තිබෙන බවත්, දැනට කෝටි 7ක් ස්ථාවර තැන්පතු වල තිබෙන බවත්, ලැබෙන පොලියෙන් මෙය සිදු කල හැකි බවත් ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රීවරුන් මහජනතාවගේ සුභ සිද්ධිය උදෙසා කටයුතු කිරීමට පත්කර එවා ඇති බවත්අපට වත්කමක් තිබෙන බැවින් මෙය සිදු කරමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එසේ නම් පුස්තකාලවල පත්තර සඳහා මුදල් ගෙවා නැත්තේ මන්දැයි ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

පරිපාලනයේ දූර්වලතා රැසක් තිබෙන බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

අනවශ්‍ය පත්තර රැසක් තිබෙන බවත්,ඒවා නතර කර දැමූ බවත් පත්තර සියල්ලම මිලදී ගෙන ලක්ෂ 08ක් පමණ ගෙවීම් කටයුතු සිදු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය මන්ත්‍රීවරුන්ට පවසා එලක් නොවන බවත්,කමිටුව මඟින් තීරණයකර ඇති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් ප්‍රජා කමිටු සභාපති ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා සමඟ කතා කල බවත් ඒ අනුව මෙලෙස තීරණය කල බවත් දරුවන්ට අවශ්‍ය පත්තර සියල්ලම ලබා ගන්නා බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

රජයේ මුදල් ඉක්මනින් නොලැබෙන බවත්, මෙහිදී යකඩ වැස්සට තෙමෙනවාද යන්න සභාව විසින් තීරණය කල යුතු බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය අනිවාර්යයෙන්ම සිදු කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

දිරන යකඩ සභාවට අයත් නොවන බවත්, ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමසිංහ මහතා ජ්‍යේෂ්ඨතම මන්ත්‍රීතුමෙකු වී ලොකුම වරද නිවැරදි කරන බවත් මෙය සිදු කල යුතු වැඩ කටයුත්තක් බවත් නමුත් අවශ්‍ය මුදල් නොලැබී ඇති බැවින් මේ පිළිබඳව තමන් කතා කල බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.රටේ අතිගරු ජනාධිපතිතුමාද,ගරු අගමැතිතුමාද,ගරු මුදල් ඇමතිතුමාද හෙට දින සිට දෙවේලක් පමණක් ආහාර ගැනීමට සිදු වන බව පවසන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව......

වෙන්නප්පුව ආසනයේ කිසිවෙකුට බඩගින්නක් නොමැති බවත් ,සඳුදා දින බාස් වරුන් කිසිවෙකු වැඩට නොඑන බවත්, මෙය සිදු කල යුතු බවත්, රජයේ මුදල් නොලැබුණද මෙය සිදු කල යුතු බවත්, මෙහි වියදම් වූ මුදල වසර 5කින් ලැබෙන බවද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.විපක්ෂ නායකතුමා පැවසූ දෙයට එකඟ බවත්,මෙය ඉක්මනින් සිදු කරමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී. පොලවල් වල ආදායම නොලැබී යන බවත් අලුත් ක්‍රමවේද වලට යා යුතු බවත් මෙය මෙම මොහොතේ නැවතුනහොත් නැවත සිදු කර ගැනීමට නොහැකි වන බවත් මේ වන විට ඇස්තමේන්තු සකස් කලද කොන්ත්‍රාත්කරුවන් නොපැමිණෙන බවත් ප්‍රකාශ කරන ලදී.

එසේ නම් මෙම මුදල් නොලැබුණද මෙය ඉදි කිරීමට මුදල් කමිටුවේදී තීරණය කිරීමට තිබූ බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

එම මුදල කෙසේ හෝ ලබා ගැනීමට උත්සාහ කරමුයැයිද, නමුත් මුදල ලැබුණද නොලැබුණද මෙය සිදු කල යුතු බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ක්‍රමවේදයේ වරදක් ඇති බවත්, මෙම කටයුත්ත සිදු කල යුතු බවත් එසේ නම් තම විරෝධයද සටහන් කර ගන්නා ලෙසත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.

පවසන සියල්ල  සත්‍ය බවත්,නමුත් වටිනාකමක් තිබෙන මෙවැනි දේවල් සිදු කරගෙන යන්නේද නාස්ති වීමට ඉඩ ලබාදෙන්නේද යන්න සිතා බැලිය යුතු බවත්,විවිධ අදහස් ඉදිරිපත් කිරීමට හැකි බවත් ඕනෑම දෙයක හරි වැරැද්දක් සාධාරණ අසාධාරණ තාවයක් තිබෙන බවත් නමුත් ප්‍රතිපලය දෙස බැලිය යුතු බවත් මෙහි ප්‍රතිලාභ ජනතාවට ලැබෙන බවත්  ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.මුදල් නාස්ති කර නොමැති බවත්,මුදල් සභාවේ තිබෙන බවත් මෙය සියළුම දෙනා එකතු වී සහයෝගයෙන් සිදු කරමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව......

එසේ නම් අමත්‍යාංශය මේ සඳහා ගාවනොගන්නා ලෙසත් ගිණුමේ මුදල් තිබෙන බැවින්ද මෙය අත්‍යවශ්‍ය කටයුත්තක් බැවින්ද,මේ සඳහා තවත් ලක්ෂ 100ක්වත් වැය නොවන බැවින්ද එය වියදම් කර මෙම කටයුතු අවසන් කරමුයැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ගිවිසුම නතර කලහොත් අමාතංශයේ මුදල් නොලැබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.තමන් උත්සාහ කරනුයේ සභාවේ මුදල් ඉතිරි කර මෙම මුදල ලබා ගැනීමට බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මේවා පිළිබඳව මුදල් කමිටු සාමාජිකයින් වැඩිදුර දන්නා බවත්,අනෙක් මන්ත්‍රීවරුන් දන්නේ මෙම වාර්තාවේ සඳහන් වන දේ පමණක් බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

රාජ්‍ය පරිපාලනය තුළ පැවසූ සියල්ල සත්‍ය බවත්, නමුත් අප ප්‍රදේශයේ ජනතාව කසල වලින් වැසී යාමට ඉඩ ලබා දෙන්නේදැයිද සිතිය යුතු බවත් අක්කර 4ක් හෝ ලැබීම පිළිබඳව සතුටු වියයුතු බවත්,මෙම දිස්ත්‍රික්කයේ කිසිදු සභාවකට මෙලෙස ලැබී නොමැති බවත් එබැවින් මෙමඟින් ප්‍රයෝජන ගනිමුයැයි රු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.තිස්කෝටියක මුදලක් සභාවට ලැබී ඇති බවත් එලෙසම එලෙසම මේවාද ඉදිරි අනාගතයේදී ලැබෙන බවත් පවසමින් අප සභාව හිඟන ප්‍රාදේශීය සභාවක් නොවන බවත් මෙහි මන්ත්‍රීවරයෙකු ලෙස පත් වී පැමිණීම විසනාව බවත් එය ප්‍රයෝජනයට ගෙන ඉදිරියට යමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරණායක මැතිණිය නොරොච්චෝලේ බලාගාරය සෑදුවේ නම් එම මුදලින් බලාගාර දෙකක් සෑදීමට තිබූ බවත් එම අවස්ථාවේදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට එය ඉදි කිරීමට දෙගුණයක් වියදම් වූ බවත් පවසමින් එලෙස වැඩ කල් නොදමා ඉක්මනින් මෙම කටයුතු සිදු කරමුයැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

1975....... සම්මේලනය අවස්ථාවේදී සිරිමාවෝ බණ්ඩාරණායක මැතිණිය අගමැතිනිය වී සිටි අවස්ථාවේ කටුනායක මාර්ගය පලල් කිරීමට ගිය විට එතුමියට බැන වැදුන බවත්, අද වන විට කුමක් සිදු වී ඇතැයිද පවසමින් එලෙසම මෙහි ප්‍රයෝජනය වෙන්නප්පුවේ දරුදැරියන්ට ලැබෙන බවත් ඒ සඳහා වැඩිහිටියන් ලෙස දායක විය යුතු බවත් පරිපාලනය තුළින් සභාවට ලැබිය යුතු මුදල් ලබා ගැනීමට උත්සාහ කල යුතු බවත් රු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතාද ලිහිරියාගම පොළ පිළිබඳව කතා කල බවත් මුදල් කමිටුවේදී ලක්ෂ 09කට ටෙන්ඩර් කැඳවීමට තීරණය කල බවත් තමන් හා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ගොස් එය නිරීක්ෂණය කලවිට වෙළඳුන් හැට ගණනක් සෑම ඉරිදාම සිටි බවත්, ගරු සභාපතිතුමා එම වරද සිදු කල බවත් නිලධාරීන්ට ගොස් නිරීක්ෂණය කර එලෙස වෙළඳුන් විසි ගණනක් සිටින බවට පැවසිය නොහැකි බවත් හැකි නම් එම පොළද ටෙන්ඩර් කරමුයැයි ද ප්‍රකාශ කරන ලදී.

සභාව හිඟන සභාවක් නොවන බවත් කෝටි ගණනක මුදල් තිබෙන බවට විශාල කතිකාවතක් ගිය බවත් ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී. නමුත් කහටවිල කොට්ඨාසය භාර මන්ත්‍රීවරිය ලෙස තමන් ඉතාමත් කණගාටුවෙන් මෙය පවසන බවත් 2021 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් මහායායවත්ත ප්‍රජා ශාලාවට අත්තිවාරම දැමූ බවත් එහි කොන්ත්‍රාත්කරු එදිනෙදා ජීවිකාව සපුරාගන්නා පෙදරේරු කර්මාන්තයේ යෙදෙන පුද්ගලයෙකු බවත් ප්‍රකාශ කරන ලදී. එම පුද්ගලයා ඉතාමත් අපහසුවෙන් එම වැඩකටයුතු කලද මේ වන තෙක් සංඛ්‍යාත්මකව නිවැරදිව පැවසිය නොහැකි නමුත් ලක්ෂ 2 ½ පමණ වන මුදල ලැබී නොමැති බවත්, මේ වන විට

ඔහුට ගමනාගමනයටම විශාල මුදලක් වියදම් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. තමන් විමසන සෑම විටම වවුචරය කර්මාන්ත අංශයෙන් ගිණුම් අංශය වෙත ගිය බව පවසන බවත් ප්‍රකාශ කරන ලදී.

යම් විට වාර්තාව වල අඩුපාඩු ඇතැයිද නැතිනම් ගෙවීම් සිදු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තමන් කර්මාන්ත කමිටුව අවස්ථාවේ කතා කල බවත්,කර්මාන්ත අංශයට කතා කල බවත්, ලේකම්තුමාටද කතා කල බවත් ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රමාලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී. අඩුපාඩුයැයි පැවසූ සෑම විටම එම පුද්ගලයා අවශ්‍ය ලිපිලේඛණ ගෙනා බවත්, කර්මාන්ත අංශය ලිපි ගොණුවක් භාර ගැනීමේදී එහි අඩුපාඩු එම අවස්ථාවේදීම බලා දැනුවත් කලයුතු බවත් ප්‍රකාශ කරන ලදී.එම පුද්ගලයා නැවත තම කොට්ඨාසය තුළ කිසිඳු ඉදි කිරීමක් නොකරන තත්ත්වයකට පත් වී ඇති බවත් තමන් මෙය සභාවේ කතා කිරීමට නොසිටි බවත්, නමුත් කෝටි ගණන් වලින් කතා කිරීමේදී ලක්ෂ 2 ½ ක මුදලක් ගෙවීමට නොහැකිදැයිද විමසා සිටින ලදී.තමන් කොන්ත්‍රාත්කරු සමඟ ගණුදෙණුවක් සිදු කරනෙ කතා නොකරන බවත් තමන් මේ පිළිබඳ සෑම තැනම කතා කල බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම පත්තර 2ක් පමණ පුස්තකාලවලට ලබා දෙන බවට පැවසූ බවත් නමුත් අඩුආදායම්ලාභීන් රැසක් සිටින මහායායවත්ත ප්‍රදේශයේ මහායායවත්ත පුස්තකාලයට කිසිඳු පුවත්පතක් මාස 4ක පමණ සිට ලැබී නොමැති බවත්, කෝටි ගණන් මුදල් තිබෙනම් මෙවැනි පුංචි දෑ මඟ හැරෙන්නේ මන්දැයිද ඉස්මතු කර පෙන්වූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.ඒවා ගැනද සැලකිලිමත් වන ලෙසට ඉල්ලා සිටින ලදී.

කිරිමැටියාන, කහටවිලවත්ත,සිරිගම්පල,ලුණුවිල යන පුස්තකාල 4ට පමණක් පත්තර අර්බුදයක් තිබෙන බවත්, පත්තර නියෝජිතයින් පසුගිය කාල සීමාවේදී අදාල පුවත්පත් සපයා දීමට නොහැකි තත්ත්වයට පත් වී තිබූ බවත්, එමෙන්ම පසුගිය දිනවල පුස්තකාල වසා තිබූ කාලසීමාවේදීද පත්තර ගැනීමට පැවසුවද බිල්පත් ගෙවීමට නොහැකි බැවින් පත්තර දෙකක් පමණක් ලබා ගැනීමට කමිටුව තීරණය කල බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදි. උප කාර්යාල වෙතින් බිල්පත් ප්‍රධාන කාර්යාලයට ලැබීමේ ප්‍රමාදයක් තිබෙන බවත්, පත්තර ඒජන්සිකරුවන් උපකාර්යාලයට බිල්පත් සපයන බවත් ප්‍රකාශ කරන ලදී.

ඒවා කෙලින්ම සභාවට ගෙන්වා ගනිමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

දෙමළ පත්තරවල ගැසට් නිවේදන යන බැවින් සමස්ථයක් ලෙස දෙපාර්තමේන්තු ලබා දී ඇති තීන්දු වලදී දෙමළ පත්තරයද ගත් බවත්, එබැවින් අවශ්‍ය ස්ථාන 2කට එනම් වෙන්නප්පුවට සහ කිරිමැටියානට පත්තර 2ක් තබා අවශ්‍ය නොවන පුස්තකාල වලට එසේ පත්තර නොතබමුයැයි කමිටුව මඟින් සාකච්ඡා කර ගත් බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

සෙන්දිරියාමුල්ල ඉඩමේ අයිතිය සභාවට නොමැති බවත්, මෙය කරගෙන යාමට සභාවට අවසරයක් පමණක් ලැබී ඇති බවත් එබැවින් විෂය භාර නව අමාත්‍ය හරීන් ප්‍රනාන්දු මැතිතුමාට සිහි කැඳවීමක් හෝ ඉල්ලීමක් ඉක්මනින් සිදු කරමුයැයි ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති මාරු වී නොමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය ඇමතිවරයා සතුව තිබෙන බවත්,එමෙන්ම මෙම ව්‍යාපෘති කරගෙන යන බවට මාදම්පේ ආයතනයද දැනුවත් කරන ලෙසට ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් ලබන සතියේ කොළඹ ගොස් සභාපති හමුවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ සිදු වනුයේ ඉඩමේ සංවර්ධන කටයුතු සිදු නොකර සිටියදී බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව පළමුවෙන්ම ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මියට පිළිතුරු ලබාදෙන බවත්,4වන මස මන්ත්‍රීතුමියට චෙක්පත රැගෙන යන ලෙසට දැනුම් දී ඇති බවත්, තවමත් චෙක්පත මුදල් අයකැමි ලඟ තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම මෙම කොම්පෝස්ට් අංගණය 2021 වර්ෂයේ හදිසියේ පැමිණි ව්‍යාපෘතියක් බවත්, එබැවින් මෙය කමිටුවකට දැමීමටවත් කාලය නොතිබුන බැවින් 2021-08-03 වන දින ලිපිය යැවූ බවත්, එය 08/24 වන දින පලාත් සභා අමාත්‍යාංශයෙන් අනුමත වූ බවත් ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී. එම අවස්ථාවේදී ලිඛිතව කොම්පෝස්ට් අංගණය දෙකෝටි තිස් එක් ලක්ෂයක්ද,සේවක විවේකාගාරයට ලක්ෂ ලක්ෂ තිස්නවයක් වෙන්කර ලබා දුන් බවත් , ඒවායේ බල කඩදාසි එලෙසම තිබෙන බවත්, ඒවාත් සමඟ වැඩ කටයුතු ආරම්භ කළ බවත් , ඉංජිනේරු නිර්දේශ මත මිළ ගණන් කැඳවූ බවත් , තෝරාගත් කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම අත්සන් කර ඇති බවත්, එම කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම සභාව මඟින් අත්සන් කර ඇති බවත් , එබැවින් ඕනෑම අවස්ථාවක සභාවට විරුද්ධව කටයුතු කිරීමට කොන්ත්‍රාත් කරුට හැකි බවත් ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.අවසන් කොට මුදල් ගෙවිය යුතු බවට සඳහන් නොවන බවත්,ආරම්භයේදී 20%ක මුදල ගෙවිය හැකි බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. මුදල් ඉල්ලා අමාත්‍යාංශයට යොමු කලද එම මුදල නොලැබුණ බවත් සභාව මඟින්ද ගෙවීම් නොකල බවත් කොන්ත්‍රාත්කරු කොටස් 3කට මුදල් ලබාගෙන ඇති බවත් සෑම බිලක්ම ඉංජිනේරුමහතා අනුමත කර පසුව මුදල් කමිටුවට යොමු කර ලිපි ලේඛණ සලකා බලා ගෙවීම් කල බවත් මෙම කටයුත්ත කරගෙන යා යුතු බැවින් එසේ මුදල් ගෙවූ බවත් ප්‍රකාශ කරන ලදී.

බිල් කිරීමේදී රැගෙන එන ද්‍රව්‍යයටද සමඟ යකඩද එම බිලට ඇතුළත් වන බවත්, එම යකඩ මිලදී ගැනීමටමේ වන විට එම මුදල මෙන් හතරගුණයක් පමණ වැය වන බවත්, එය සභාවට වාසියක් බවත් ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී. ලක්ෂ 39ක ගොඩනැඟිල්ලේ වැඩ අවසන් බවට ලිපියක්ද ලබා දුන් බවත්, එහි මුදල් ලබාදෙන බවටද පැවසූ බවත්, එහිදී ලක්ෂ 10ක ප්‍රමාණය සභාවට ලැබී ඇති බවත් ඉතිරි මුදලහෙට දින රැස්වීමේදී යම්විට ලැබේයැයි සිතනා බවත් ප්‍රකාශ කරන ලදී. මේවා

අමාත්‍යාංශයේ සණ අපද්‍රව්‍යය ඒකකයේ අවිච්චින්න කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.ජුනි මාසය වන විට අවසන් කරන බවට පැවසුවද මේ වාතාවරණය උඩ එයද සිදු කර ගැනීමට නොහැකි වී ඇති බවත්,නමුත් වරින් වර ගිවිසුම් අළුත්කර නීත්‍යානුකූලව සිදු කර ඇති බවත්, එබැවින් මෙහි ගෙවීම් කිසිඳු විටක අවිධිමත් ගෙවීම් නොවන බවද ප්‍රකාශ කරන ලදී. මේවා සඳහා නිතරම මුදල් කමිටු තීරණ ගෙන පරීක්ෂා කර බලා පුළුවන්කමක් තිබෙන බැවින් ගෙවීම් කල බවත්, මුදල් පැමිණීමට පෙර ගෙවීම් කල ව්‍යාපෘති ඕනෑතරම් මෙම සභාවේ තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.මේ වන විට ලක්ෂ 48 ගෙවා ඇති බවත්, පැහැදිලි ලිපිගොණු ඉදිරිපත් කර ඉතිරි ලක්ෂ 25ටද මුදල් කමිටුවේ අනුමැතිය ගත් බවත් ප්‍රකාශ කරන ලදී.මෙතැනින් ඉදිරියට කටයුතු කිරිමට රේට් වෙනස් වන බැවින් ඒ සඳහා නව ඇස්තමේන්තු සකස් කිරීමටද සිදුවේයැයිද නැතිනම් මෙම ගිවිසුම නතර කර නැවත මිල ගණන් කැඳවා ගිවිසුම් ගත වීමට සිදු බවත් ඉතිරිය සභාව මඟින් මුදල් වියදම් කර සාදන්නේ නම් මෙය මෙතැනින් නවතා නැවත කොන්ත්‍රාත්කරුවෙකු ගෙන මෙම කටයුතු සිදු කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.

එසේ නම් සභාවේ මුදල් වැය කර සාදා අවසන් කරමුයැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

සම්පූර්ණ බිලම ගෙවීමට සිදු වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තවත් කුඩා වැඩකටයුත්තක් පමණක් ඉතිරි වී ඇති බවත්, වහලයේ කටයුතු නිම වූ පසුව මෙම අංගණයේ කටයුතු ආරම්භ කල හැකි බවත් ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

වහලයේ වැඩ කටයුතු අවසන් කිරීමට ලක්ෂ 50ක් පමණ වැය බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

යකඩ මිලදී ගැනීම තුළින් සභාවේ වත්කම් වැඩි වී ඇති බවත් එය විශාල වත්කමක් බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් ලේකම්තුමාගේ පිළිතුර සමඟ කිසිසේත්ම එකඟ නොවන බවත්, 05/06 වන දින පැවති කර්මාන්ත කමිටුවේදී චන්දිමාල් මහතාගේ විමසීමේදී ලබන අඟහරුවාදා එම පුද්ගලයාට දුරකථන ඇමතුමක් ගන්නා ලෙසට පවසන ලෙසත් කෙසේ හෝ මුදල් ලබා ගැනීමට උත්සාහ කරන බවත් තමන්ට පැවසූ බව ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.මෙහිදී ලේකම්මහතා තමාට චෙක්පත භාරගන්නා ලෙසට පවස ඇති බවට ප්‍රකාශයක් කල බවත් තමන්ට නොව කොන්ත්‍රාත්කරු සභාව සමඟ ගිවිසුම්ගතවී ඇති බවත් කොන්ත්‍රාත්කරු සමඟ කතා කර නොමැති බවත් තම ඉල්ලීම මත මෙම වැඩ කටයුත්ත සිදු කල බැවින් මෙහිදී තමන් කතා කරන බවද දුන් පිළිතුර සමඟ එකඟ නොවන බවද ප්‍රකාශ කරන ලදී.

එය සොයා බලා හැකි ඉක්මනින් සිදු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

බණ්ඩිරිප්පුව කසල රැස් කරන ස්ථානයේ ට්‍රැක්ටර් රථ වලින් කසල ගෙනැවිත් දමන බවත්,මාර්ගයේ ජනතාවට ගමන් කල නොහැකි බවත් මේ සඳහා ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසත් ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා ප්‍රකාශ කරන ලදී.
මේ දිනවල වර්ෂාව බැවින් කසල දමන ස්ථානයට ට්‍රැක්ටර් රථ වලට ගමන් කල නොහැකි බැවින්ද ,ජනතාව කසල ගෙන යාමට නොපැමිණි විට මෙම ස්ථානයට කසල ගෙනැවිත් දැමීමට පුරුදු වී සිටින

බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙය තාවකාලික ගැටළුවක් බවත් සඳුදා දිනයේ සිට ඩීසල් නොමැති බැවින් ට්‍රැක්ටර් රථ වැඩ නොකල බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 09

2022.03.29/2022.04.29 සහ 2022.06.02 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාගේ සහ ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

ii. 2022.05.06 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව සලකා බැලීම

කාපට් කිරීමට ප්‍රධාන මාර්ග කීපයක් යෝජනා කර තිබූ බවත්, ණය ගෙවා ගැනීමට නොහැකිව කොන්ත්‍රාත්කරුවන්ට අපහසු වී ඇති බැවින් දීර්ඝ කාලයක පටන් කාපට් කිරීම සිදු නොවන බවත් වෙන්නප්පුව කනත්ත අසල මාර්ගය, ලූකස්වත්ත සහ බර්නාඩ්වත්ත පාර, යෝගියාන සෝභිත නායක ස්වාමීන් වහන්සේ වැඩසිටින පන්සල පාර, පොල්පැළ සිටවූ හාල්දඩුවන ගොවිජන සේවා මධ්‍යස්ථානය පාර යන මාර්ග විශේෂ ව්‍යාපෘතියක් යටතේ හෝ මාර්ගවල වලවල් වසා හෝ ජනතාවට යාමට හැකි පරිදි සකස් කර දීමට සිදු වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. එය සෑදීම සභාවෙන් කල නොහැකි බවත් ඇස්තමේන්තුගත කර මේවා මාස 2ක 3ක කාලයක් ඇතුළත ප්‍රතිසංස්කරණය සිදු කරමුයැයිද මේවා 2018 වර්ෂයේ පටන්ගත් මාර්ග බවත් එවැනි මාර්ග කීපයක්ම තිබෙන බවත් කෙතරම් අහේනි අමාරුකම් තිබුණද ජනතාව බදු ගෙවන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.එමෙන්ම තමන් කිසිදු පැකිලීමකින් තොරව රතු නිවේදන බෙදූ බවත් ඉන්පසුව අද වන විට මුදල් සූදානම් බව පැවසූ බවත් එමෙන්ම ආදායම්/වියදම් වාර්තා ගෙන බැලීමේදීද මුදල් ලැබී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. කනත්ත පාරින් දිනකට මෘතදේහ දෙකක් තුනක් රැගෙන යන බවත් මේ වන විට මාර්ගය සම්පූර්ණයෙන්ම ජරාජීර්ණ වී ඇති බවත් එම මාර්ග නඩත්තු කර සකස් කර දීමට කටයුතු කරමුයැයිද ප්‍රකාශ කරන ලදී. ඊළඟ කර්මාන්ත කමිටුව අවස්ථාවේදී එය සාකච්ඡා කරන ලෙසද මෙයට ප්‍රමුඛස්ථානය ලබාදෙන ලෙසටද ඉල්ලා සිටින ලදී.

මේවා සභාවට අයත් නොවේදැයිද, තම කොට්ඨාසයේද එවැනි මාර්ග තිබෙන බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

ඒවා සභාවට අයත් මාර්ග බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සකස් කර තිබෙන ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීමට නොහැකි බවත්, නව රේට්ස් පැමිණියේදැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

ලබන සතියේ ඒවා ලබා දෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙවැනි මාර්ග තවත් තිබේනම් නිලධාරීන් යොදවා පරීක්ෂා කර ලැයිස්තුවක් ගන්නා ලෙස ගරු සභාපතිතුමා ලේකම්මහතාට දැනුම් දෙන ලදී.

සෑම කොට්ඨාසයකම ව්‍යාපෘති 50% නිම කර ඊළඟ වටයට යමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

අද වන විට 100% වැඩ අවසන් කල මන්ත්‍රීවරුන් කීපදෙනෙකුම සිටින බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙවැනි තීරණ ගත් විට අනෙක් මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් සිදු වන බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මන්ත්‍රීවරුන්ට වෙන් කල ලක්ෂ 18 මෙයට අදාල නොවන බවත්, ප්‍රමුඛස්ථානය කරගෙන මෙම කටයුතු සිදු කරදෙන ලෙසට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අදාල කොට්ඨාසයේ මුදල් අවසන් වී තිබේදැයිද ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රයංකර මහතා විමසා සිටින ලදී.

මාර්ග නඩත්තුවේ මුදල් තිබෙන බවත්, එම මුදල් මාරු කර ගැනීමට සිදු වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගිය වසරේ ප්‍රිමික්ස් දැමීමට වෙන් කල මුදල් තිබෙන බවත්, ඒවාට කුමක් සිදු වූයේයැයිද ඒ සඳහා යෝජනාද ලබා දී ඇති බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 10

2022.05.06 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ සහ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

iii. 2022.05.26 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

ගරු මන්ත්‍රීවරුන්/වරියන් 44 දෙනාම ආදර්ශමත් ගෙවත්තක් නිවසේ සකස් කරමුයැයි තමන් යෝජනා කරන බව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

කොම්පෝස්ට් අංගණයේ කොටසක් ගෙවත්තක් වෙනුවෙන් වෙන්කර දෙන ලෙසට යෝජනා කරඇති බවත්, එහි වැඩ කටයුතු ඉක්මනින් ආරම්භ කරන ලෙසත් ඒ සඳහා සභාවේ සේවකයින් යොදා සිදු කරමුයැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

පොලොන්නරුවේ සිට පැමිණෙන සභාවේ සේවකමහතෙකු නයිම්රිස් පැළයක් රු.4 බැගින් පැළ 100 ගෙනා බවත්,ඒවා ගෙනැවිත් අවශ්‍ය කෙනෙකුට ලබා දිය හැකි බවත්,මඤ්ඤොක්කා දඬුද ඉල්ලා ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මාර්ග සැදීම නවතා වගා කටයුතු සිදු කරමුයැයිද ගරු ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 11

2022.05.26 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතාගේ සහ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

iv. 2022-06-07 ක්‍රීඩා සංවර්ධන සහ ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරීමේ කාරක සභා වාර්තාව සලකා බැලීම
මෙහිදී යෝජනා සහ සාකච්ඡා කලයුතු කරුණු රැසක් තිබුණු බවත් ඒවා මුදල් කමිටුවට යොමු කිරීමෙන් අනතුරුව හදිසි ක්‍රීඩා කමිටුවක් කැඳවා ඒවා ක්‍රීඩා කමිටුවටම යොමු කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම කමිටු වාර්තාව අද දින ලැබුණු බැවින් එය පරිහරණය කිරීමට කාලයක් නොමැති වූ බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහි ගැටළුවක් තිබේ නම් පසුව ඉදිරිපත් කරන ලෙසට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

තීරණ අංක 12

2022-06-07 ක්‍රීඩා සංවර්ධන සහ ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරීමේ කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ සහ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

## <u>05.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම</u>.

**i. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය -2022 අප්‍රියෙල්**

**ii. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය -2022 අප්‍රියෙල්**

**ණයගැති තොරතුරු විස්තරාත්මකව තිබෙන බවත්, එය ලබා දීම පිළිබඳ ස්තුතිවන්ත වන බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. 2022-04-30 වන දිනට ශේෂය ...........බවත්,15% ප්‍රගතියක් තිබෙන බවත් මෙහිදී ප්‍රකාශ කල අතර සේවක සංඛ්‍යාවද වෙන වෙනම සඳහන් කර තිබෙන බවත් ඔවුන්ගේ කාලයද දීර්ඝ කල බැවින් එම කටයුතු වල ප්‍රගතිය විමසා සිටින ලදී.**

**කණ්ඩායම් වශයෙන් ආදායම් පරීක්ෂකවරුන් දමා හිඟ ලබා ගැනීමට සූදානම් වන බවත්, ඒ සඳහා රැස්වීමක් අද දින සවස පැවැත්වෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**එම සියළු දෙනාටද ප්‍රදේශ වෙන් කර තිබේදැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී.**

**වෙන් කර තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**මෙහිදී දළ සටහනක එම එක් එක් ප්‍රදේශ සඳහා තිබෙන හිඟ වෙන් කර ගැනීමට හැකිනම් එය යෝග්‍ය බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. එවිට ලේකම්මහතාට සීමාව තුළ හිඟ පෙන්වීමට හැකි වන බවද, උළුමෝල් වැනි ගණනය මෙයට එකතු වන්නේදැයිද විමසා සිටින ලදී.**

**එය තීරණයක්ගෙන ඉවත් කල බවත්, එම ඉඩමේ උළුමෝල නොමැති බවත්, දිගටම හිඟය පැමිණි බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.**

**ප්‍රධාන ගිණුමට හිඟ සහ නොහිඟ දෙකම එකතු වී එන බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.**

| |
|---|
| තීරණ අංක 13<br><br>2022 වර්ෂයේ අප්‍රියෙල් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ 2022 වර්ෂයේ අප්‍රියෙල් මස ඒකාබද්ධ ගෙවීම් සාරාංශය පිළිබඳ වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය |

**iii. 2022 මැයි මස ඉන්ධන හා අළුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව සලකා බලන ලදී.**

**iv. 2022 වර්ෂයේ මැයි මස වීථි පහන් නඩත්තු කිරීම පිළිබඳ ප්‍රගති වාර්තාව සලකා බලන ලදී.**

## <u>06. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.</u>

(i). ගරු මන්ත්‍රි කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ ගෘහස්ථ ක්‍රීඩාංගණය තුළ ප්‍රධාන විදුලි පහන් 35ක් තිබෙන බවත්,ඒවායෙහි ඇතුළත LED බල්බ 4 බැගින් තිබෙන බවත් මේ වන විට එම යම් බල්බ නිවී නිවී පත්තු වන තත්වයටද යම් බල්බ විසන්ධි වී ගොස්ද ඇති බව ප්‍රකාශ කරන ලදී.මේවා ඉක්මනින් ප්‍රතිසංස්කරණය කරන ලෙසටද ඉල්ලා සිටින ලදී. එමෙන්ම එළිමහන් ක්‍රීඩාංගණයට පැමිණෙන ෆැබ්රෝනියා මාවතේ ගේට්ටුව යටින් දිරාපත් වී අබලන් වී ඇති බවත් මේ සඳහා ඉඩම් කැබලි කරන මහතෙකුගේ හෝ සහය ලබා ගතහොත් ඉතාමත් අඩු මුදලකට එය කර ගැනීමට හැකි බවත් මේවා සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලෙසටද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ සඳහා තමන් සොයා බලා ඉක්මනින් ඉදිරි කටයුතු සිදු කරන බවත්,පසුගිය දින ක්‍රීඩා කමිටුව පවත්වා එම ගැටළු සාකච්ඡා කිරීම පිළිබඳව ගරු මන්ත්‍රි කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාට ගරු සභාපතිතුමා ස්තුතිය පුද කරන ලදී.

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.